ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

31 වෙළුම | 3-4 කලාපය | 2012 මාර්තු - අප්‍රේල්

## හෙට වෙනුවෙන් BRICS



ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# හෙට වෙනුවෙන් BRICS

දෙවන ලෝක යුද්ධයෙන් අනතුරු ව ලෝකය දේශපාලනික ව වම සහ දකුණ වශයෙන් ධ්‍රැවීකරණය වුව ද ආර්ථික මුදුන් මුල් බටහිර ම රැඳිණි. විශේෂයෙන් ම, බ්‍රෙට්න්වුඩ්ස් එකඟතාව තුළට සියලු රටවල් ගොනු වී සිටියහ. එම කාරණයේ දී වම - දකුණ භේදය ඉස්මතු නො වී ය. වම ද දකුණ ද එක ලෙසින් ම ලෝක බැංකුවේත් අන්තර්ජාතික මූල්‍ය අරමුදලේත් මූලිකත්වය පිළිගත්හ. සෝවියට් දේශය මුල් කරගත් වාමවාදී කඳවුර බිඳ වැටීම නිසා එම මූලිකත්වය තවදුරටත් ශක්තිමත් විය. ලෝක ආර්ථිකය පිළිබඳ ව තීන්දු තීරණ ගන්නා ප්‍රධානතම ආයතන බවට ඒවා පත්විය.

වාමවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු ඉතිහාසයේ අවසානය සනිටුහන් වූ බවට ද මත පළ විය. වොෂින්ටන් එකඟතාවෙන් තොර විකල්පයක් ලෝකයට නොමැති බව ද පුන පුනා කියැවෙන්නට විය. මේ පාළු ගෙයි වළං බිඳීම තුළ අන් සරණක් නැති එක ම ප්‍රවාහයක් තුළට තල්ලු වී යන්නටත් ඒ තුළ විවිධ වූ අතවරවලට ගොදුරුවන්නටත් පරිධියේ රටවලට සිදු විය. ආර්ථික රෝගවලට පිළියමක් වශයෙන් එක ම එක වට්ටෝරුවක් නියම කෙරිණි. එම තෛලය විවාදයකින් තොර ව ම භාවිතයට ගැනිණි.

කෙ සේ වුව ද, මේ සම්බන්ධයෙන් විවිධ වූ විවේචන අනවරත ව නැග එන්නට විය. ගෝලීයකරණයට එරෙහි සටනක් වශයෙන් ද බහුජාතික සමාගම්වල ආධිපත්‍යයට එරෙහි ව නැගිටීමක් වශයෙන් ද ඒ හඬ නැගිණි. බ්‍රෙට්න්වුඩ්ස් එකඟතා ඉතාමත් දැඩි ව විවේචනයට ලක් විය. නව ලෝක එකඟතාවක් වෙනුවෙන් කටයුතු කළ යුතු බවට ද අදහස් පළ විය. බ්‍රෙට්න්වුඩ්ස් ආයතනවල බලාධිකාරයේ වෙනසක් වෙනුවෙන් ද යෝජනා ඉදිරිපත් විය.

එම විවේචන, විරෝධතා සහ ප්‍රතිසංස්කරණ යෝජනා ආදියෙන් පමණක් ම ලෝකය වෙනස් කළ හැකි නො වේ. ලෝකය නව අතකට යොමු කළ හැක්කේ ශක්තිමත් විකල්පයක් ගොඩ නංවා ගැනීමෙනි. වාමවාදී කඳවුර බිඳ වැටුණ ද එහි බල කණු වශයෙන් සිටි රාජ්‍යයෝ සහ එහි ආස්වාදය ලැබූ රාජ්‍යයෝ ඉතිහාසය තුළ සැඟ ව නො ගියහ. ඒ රාජ්‍යයෝ වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය තුළ ම හිස ඔසවන්නට වූහ. වොෂින්ටන් එකඟතාවට විකල්ප වශයෙන් පෙයි-චිං එකඟතාවක් පිළිබඳ ව ද අදහස් පළවන්නට විය.

මේ වන විට, බටහිර ලෝකයේ ආර්ථික බල කණු සෙලවෙන බව ද නැගී එන කඳවුරේ ආර්ථික බල කණු ඉතා ශක්තිමත් ව ස්ථාවර වන බව ද රහසක් නො වේ. බ්‍රෙට්න්වුඩ්ස් එකඟතා ඔස්සේ ශක්තිමත් කෙරුණු එක්සත් ජනපද ඩොලරයේ ස්ථාවරත්වය පිළිබඳ ව පවත්නා සැකය දිනෙන් දින ම මෝරමින් තිබේ. විසඳුම් රහිත ව දිනෙන් දින වැඩෙන ණය අර්බුදය හමුවේ යුරෝපා සංගමයේ පැවැත්ම ද අනතුරට ලක් ව තිබේ. ආර්ථික අවපාත, මූල්‍ය අර්බුද පිළිබඳ දැනුම කුඩා දරුවන් වෙතට ද කාන්දු වෙමින් තිබේ.

නවමු ලෝකයක් පිළිබඳ බලාපොරොත්තුව සිහිනයක් පමණක් ම නො විය යුතු ව ඇත්තේ මෙම පසුබිම තුළ ය. චීනය, රුසියාව, බ්‍රසීලය, ඉන්දියාව සහ දකුණු අප්‍රිකාවේ සංගමය තුළ ඒ බලාපොරොත්තුව ඉටුවෙමින් තිබේ. ඒ, BRICS ගොඩනැගීම මඟිනි. මෙය ආරම්භයක් පමණකි. කෙ සේ වුව ද, මේ ආරම්භය හෙටක් නැති එකක් නො වේ. මේ ඉතා පැහැදිළි ඉදිරි ගමනක් ඇති ආරම්භයකි. මෙ වර සටහනින් අපි ඒ ගැන කතා කරමු.❂

සටහන ISSN 1391-3697

2012 මාර්තු/ අප්‍රේල්

පිටපතක මිල : රු. 10.00
වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

## ලිපි යොමුව

| ලිපි යොමුව | පිටුව |
|---|---|
| බ්‍රික්ස් පවුර | 3 |
| බහුමාන දරිද්‍රතා දර්ශකය | 10 |
| විදේශ විනිමය පිළිබඳ හැඳින්වීමක් | 14 |
| දකුණු අප්‍රිකාවට දැමූ රන් පොල්ල | 19 |
| 2011 වසරේ ආර්ථිකය සැකෙවින් | 24 |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# යහපත් හෙටක් වෙනුවෙන් හැදෙන
# බ්‍රික්ස් පවුර

**විනීතා හේරත්**
සන්නිවේදන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

වසර ගණනක් ඇදී ගිය දෙවැනි ලෝක සංග්‍රාමයෙහි අතුරු ඵලයක් ලෙසින් ලෝක ආර්ථිකය සහ මූල්‍ය ක්‍රමය බිඳ වැටිණි. ඒ ප්‍රපාතයෙන් ගොඩ ඒමේ අරමුණින් සහ නැවතත් ලෝක මට්ටමේ ගැටුමක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් විවිධ වූ සම්මුති, එකඟතාවලට එළැඹීමට සියලු ජාතීහු කඳවුරු බඳින්නට වූහ. පොදුවේ පිළිගත හැකි ආර්ථික සහ මූල්‍ය ක්‍රමවේදයක් සම්බන්ධයෙන් 1944 වසරේ දී ඇති කරගත් බ්‍රෙටින්වුඩ්ස් එකඟතා ද ඒ අනුව සැකසුනේ වෙයි. ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බිහිවීම සනිටුහන් කෙරුණේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි. තව ද, අන්තර් ජාතික ගනුදෙනුවල දී ප්‍රමුඛතම ගෙවුම් - පියවීම් මාධ්‍යය වශයෙන් එක්සත් ජනපද ඩොලරය පිළිගැනීමට ද එම එකඟතා ඔස්සේ සියලු ජාතීහු එකඟවූහ. ඒ හේතුව නිසා ද, ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආධිපත්‍යය නිල මට්ටමින් ම ඇමෙරිකා එක්සත් ජනපදයට සහ යුරෝපයට පවරා තිබීම නිසා ද ලෝක ආර්ථිකය සහ මූල්‍ය ක්‍රමය බටහිරට අවනත ආකාරයකින් ක්‍රියාත්මක වන්නට විය. එ බැවින්, එ කී ආයතන පිළිබඳ විශ්වාසය ද බරපතල අයුරින් බිඳ වැටී තිබේ.

දෙවන ලෝක යුද්ධයෙන් අනතුරු ව ලෝක දේශපාලනික බලතුලනය කඳවුරු දෙකකට ධ්‍රැවීකරණය වුව ද ආර්ථික සහ මූල්‍යමය විකල්පයක් ගොඩ නැඟීමට බලවත් ව පැවැති වාමවාදී කඳවුරට ද නො හැකි විය. එ කල පැවැති සීතල යුද්ධය අවසන් වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර කඳවුර හැරෙන්නට සරණ යා හැකි අන් විකල්පයක් ලෝකයට නැති බවක් පෙන්වා දෙමිනි.

එහෙත් සිවු වසරකට පෙර - එ නම්, 2008 වර්ෂයේ දී, ඇති වූ ලෝක ආර්ථික අවපාතයෙන් මෙතෙක් ලෝක ආර්ථිකයේ දැවැන්තයන් බවට පත්ව සිටි ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපය පීඩාවට පත්වෙද්දී ලෝක ආර්ථිකය ශක්තිමත් කිරීමටත් එය නව ඉසව්වක් කරා යොමු කිරීමටත් නව සංවිධානයක් බිහිවිය. එය නැඟී එන ප්‍රධාන ආර්ථික එක් ව ගොඩ නඟා ගන්නා ලද අන්තර් ජාතික දේශපාලන සහ ආර්ථික සංවිධානයකි. ආරම්භයේ දී බ්‍රික් (BRIC) යනුවෙන් හැඳින්වූයේ ද මේ වන විට බ්‍රික්ස් (BRICS) යනුවෙන් හඳුන්වන්නේ ද මෙම සංවිධානයයි. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකා යන රාජ්‍ය නාමයන් ගේ මූලාක්ෂර වන B-R-I-C-S යන ඒවායේ එකතුවෙන් මෙම සංවිධානය නම් කොට ඇත. දකුණු අප්‍රිකාව මෙයට එකතු වූයේ 2010 වසරේයි. ආරම්භයේ දී වූ BRIC යන නම BRICS බවට පත් වූයේ එ හෙයිනි. මෙම නමෙහි නිර්මාපකයා වූ කලී එක්සත් ජනපද ආයෝජන බැංකුවක් වන ගෝල්ඩ්මන් සක්ස්හි (The Goldman Sachs) අර්ථශාස්ත්‍රඥයෙක් වන ජිම් ඕනීල් (Jim O'Neill) ය. 2001 දී "Building Better Global Economic BRICs" ලිපියෙහි ඔහු මුල් වරට බ්‍රික් රටවල් ගැන සඳහන් කළේය.

බ්‍රික් සංවිධානය පිහිටුවීමේ මුල් සාකච්ඡා 2006 වසරේ දී ඇරඹිනි. ප්‍රථම රාජ්‍ය නායක සමුළුව 2009 ජූනි මස රුසියාවේ දී පැවැත්විය. සෑම වසරක ම බ්‍රික් රාජ්‍ය නායක සමුළු පවත්වනු ලබන අතර දෙවන සමුළුව 2010 දී බ්‍රසීලයේ ද තෙවැනි සමුළුව 2011 දී චීනයේ දී ද පවත්වන්නට යෙදුණි. 2010 දී දකුණු අප්‍රිකාව බ්‍රික් සංවිධානයට බැඳුනු අතර චීනයේ පැවැත්වුනු තෙවැනි සමුළුවට පළමු වතාවට එ රට ද සහභාගි විය. 2012 දී බ්‍රික්ස් සංවිධානයේ සිව්වන සමුළුව ඉන්දියාවේ නව දිල්ලියේ දී පැවැත්විණි. බ්‍රික්ස් රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල ආරක්ෂකයා මෙන් ම ප්‍රවර්ධකයා ලෙස කටයුතු කරන අතර ම ලෝක සාමය වෙනුවෙන් ක්‍රියා කරන්නෙක් ලෙස ද කටයුතු කරන බව මෙහි දී ප්‍රකාශයට පත්විය.

**ලෝක ආර්ථිකය තුළ බ්‍රික්ස් නියෝජනය**

ලෝක ආර්ථිකය තුළ බ්‍රික්ස් රටවල විශේෂතා රැසකි. මෙම රටවල් වේගයෙන් සංවර්ධනය වන, ආර්ථික ශක්තියෙන් නැඟී

එන රටවල් ය. නැඟී එන ආර්ථික අතර විශාලතම රටවල් පහ වනුයේ බ්‍රික්ස් රටවල් ය. ලොව භූමි ප්‍රමාණයෙන් ¼ කටත් වඩා මෙම රටවලට අයත් ය. ලෝක ජනගහනයට බ්‍රික්ස් රටවල දායකත්වය සියයට 42 කි. 2011 දී බ්‍රික්ස් රටවල ඒකාබද්ධ නාමික දළ දේශීය නිෂ්පාදිතය එ.ජ. ඩොලර් ට්‍රිලියන 13.6 ක් විය. එය ලෝක ද.දේ.නි. යට දක්වන දායකත්වය සියයට 25ක් පමණ වේ. ඇස්තමේන්තු කරන ලද ඒකාබද්ධ විදේශ සංචිත වටිනාකම එ.ජ. ඩොලර් ට්‍රිලියන 4 කි. එය ලෝක විදේශ සංචිතවලින් සියයට 40 ක් පමණ වේ. බ්‍රික්ස් රටවල් අතර වෙළෙඳාමේ වටිනාකම ඩොලර් බිලියන 230කි. එය ලෝක වෙළෙඳාමෙන් සියයට 18 කි. බ්‍රික්ස් රටවල් ලෝක ආර්ථිකයේ වර්ධනයට සියයට 50 කටත් වඩා වැඩි ප්‍රතිශතයකින් දායක වෙයි. මේ නිසා ලොව හෙට දවස බෙහෝ සෙයින් බ්‍රික්ස් රටවල් මත රඳා පවතිනු ඇත. මෙතෙක් ලෝක ආර්ථික බලය ජී 7 රටවලට නතු ව පැවතිණි. එහෙත් අද එම බලය බ්‍රික්ස් රටවල් ඇතුළු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙත විතැන් වෙමින් පවතී. මේ අනුව 2027 වන විට බ්‍රික්ස් ආර්ථික ජී 7 ආර්ථික ඉක්මවා යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. දිගින් දිගට ම මෙම රටවල් ආර්ථික ශක්තියෙන් නැඟී සිටිනු දක්නට ලැබේ.

2010 දී පළමු වතාවට චීනයෙහි ද.දේ.නි. ඩොලර් ට්‍රිලියන 5.88 ක් වෙමින් ඩොලර් ට්‍රිලියන 5.47 ක් වූ ජපාන ද.දේ.නි. ඉක්මවා ගියේ ය. මේ මඟින් චීනය ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය බවට පත්විය. ගෝල්ඩ්මන් සක්ස් ආයතනය විසින් 2010 ප්‍රකාශයට පත්කරන ලද වාර්තාවකට අනුව චීනය 2030 වන විට කොටස් වෙළෙඳපොළ (Equity Market) තුළ එක්සත් ජනපදය අභිභවා යනු ඇත. එ මෙන් ම එය ලොව විශාලතම කොටස් වෙළෙඳපොළ වනු ඇත. 2020 වන විට එක්සත් ජනපද ද.දේ.නි. චීනයෙහි ද.දේ.නි. යට වඩා වැඩි වන්නේ ඉතා සුළු වශයෙනි. 2030 වන විට ලෝක වෙළෙඳපොළ ප්‍රාග්ධනකරණයට බ්‍රික්ස් රටවල් එක් ව සියයට 41 කින් දායකවනු ඇත. 2011 දී බ්‍රසීලය එතෙක් එක්සත් රාජධානියට හිමි ව තිබූ ස්ථානය ගනිමින් ලොව විශාලතම ආර්ථික අතර හයවන ස්ථානයට පත් විය. යුරෝපා ආර්ථිකවලට වඩා වේගයෙන් වර්ධනය වෙමින් එය දශකයේ මැද වන විට ප්‍රංශ ආර්ථිකය ද පසු කරනු ඇතැයි ජාත්‍යන්තර සබඳතා පිළිබඳ මහාචාර්යවරයකු වූ ඔලිවර් ස්ටන්කල් (Oliver Stuenkel) පවසයි. 2001 දී බ්‍රික්ස් පිළිබඳ සංකල්පය බිහිකළ ඕනීල් අපේක්ෂා කළාටත් වඩා වේගයෙන් බ්‍රික්ස් ආර්ථික සංවර්ධනය වෙමින් පවතී. ඕනීල් ගේ මුල් වාර්තාවක සඳහන් වූයේ 2036 දී බ්‍රසීල ආර්ථිකය එක්සත් රාජධානි ආර්ථිකය ඉක්මවා යනු ඇති බවයි. එහෙත් මේ වන විටත් බ්‍රසීල ආර්ථිකය එම තත්ත්වය ළඟා කරගෙන ඇත. එ මෙන් ම චීන ආර්ථිකය එක්සත් ජනපද ආර්ථිකය 2020 දී ඉක්මවනු ඇතැයි සඳහන් වුව ද බොහෝ විශ්ලේෂකයන්ට අනුව එය ඊට පෙර සිදුවනු ඇත. 2050 වන විට බ්‍රික්ස් රටවල් ඒකාබද්ධ ව ගත් විට වර්තමානයේ ධනවත් රටවල ඒකාබද්ධතාව ඉක්මවා යනු ඇතැයි ගෝල්ඩ්මන් සක්ස් වාර්තාව සඳහන් කරයි. මන්ද, ඒවා ලෝක හා කලාපීය සම්බන්ධතා කටයුතුවලට මහත් බලපෑමක් දැක්විය හැකි, එ මෙන් ම විශාල ආර්ථික ද වන නිසා ය.

**BRICS වගතුග - බ්‍රසීලය**



**ජනගහනය**
මිලියන 192.38
ලෝක ජනගහනයෙන් 2.74%
ලෝකයේ 5 වැනි තැන

**භූමි ප්‍රමාණය**
වර්ග කි.මී. 8,514,877
ලෝකයේ 5 වැනි තැන

**නාමික ද.දේ.නි. (2011)**
එ.ජ.ඩො. මිලියන 2,492,908
ලෝකයේ 6 වැනි තැන

**ද.දේ.නි. (2050)**
එ.ජ. ඩොලර් බිලියන 11,366
ලෝකයේ 4 වැනි තැන

**විදේශ සංචිත**
එ.ජ.ඩො. මිලියන 374,272
ලෝකයේ 6 වැනි තැන

**අයවැය හිඟය**
එ.ජ.ඩො. මිලියන 88,200
ලෝකයේ 9 වැනි තැන

**රාජ්‍ය ණය**
ද.දේ.නිෂ්පාදනයෙන් 66.18%

**ජංගම ගිණුම හිඟය**
එ.ජ.ඩො. මිලියන 63,470
ලොව 6 වැනි විශාලතම හිඟය

## බ්‍රික්ස් සිවුවන සමුළුව සහ බ්‍රික්ස් එකඟතා පිළිබඳ පළවන අදහස්

2012 මාර්තු 28 - 29 දෙදින ඉන්දියාවේ නව දිල්ලි නගරයේ දී බ්‍රික්ස් සිවුවන සමුළුව පැවැත්විනි. මෙම සමුළුවේ තේමාව වූයේ "ලෝක ස්ථායීතාව, ආරක්ෂාව සහ සමෘද්ධිය සඳහා බ්‍රික්ස් හවුල" (BRICS Partnership for Global Stability, Security and Prosperity) යන්නයි. මෙම සමුළුව සමාජික රටවල් අතර මූල්‍ය සහයෝගීතාව සම්බන්ධව ඉතා වැදගත් සන්ධිස්ථානයක් සලකුණු කරයි. මෙහි දී එක් එක් සාමාජික රටට තම දේශීය මුදලින් සංවිධානයේ වෙනත් රටක ආයෝජනය කළ හැකි බවට බ්‍රික්ස් රටවල් එකඟතාවකට එළැඹීම සුවිශේෂී කරුණකි.

වෙළෙඳාම, ආර්ථික සහ මූල්‍ය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට සමුළුවෙන් අනතුරුව නිකුත් කරන ලද දිල්ලි ප්‍රකාශනය මඟින් බ්‍රික්ස් රටවල නායකයෝ ප්‍රතිඥා දුන්හ. ඒ ඒ රටවල් අතර දේශීය මුදලින් ගනුදෙනු කෙරෙන ඉතා වැදගත් වෙළෙඳ හා මූල්‍ය ගිවිසුම්වලට ඔවුහු අත්සන් තැබූහ. එ මෙන් ම එකිනෙකා අතර ණය පහසුකම් ප්‍රසාරණය කිරීමේ අරමුණින් ද එම ගනුදෙනු ඒ ඒ රටවල මුදල් වලින් සිදුකිරීමට පහසුකම්

සැපයීමට එකඟ වූහ. සාමාජික රටවල් අතර ඒවායේ ව්‍යවහාර මුදලින් සිදුකිරීමට නියමිත ගනුදෙනු, ණය පහසුකම් පිළිබඳ ප්‍රධාන ගිවිසුමට බ්‍රසීල සංවර්ධන බැංකුව (Brazilian Development Bank), සංවර්ධනය සහ විදේශ ආර්ථික සම්බන්ධතා කටයුතු පිළිබඳ රුසියානු රාජ්‍ය බැංකුව (State Corporation Bank for Development and Foreign Economic Affairs of Russia), ඉන්දියානු ආනයන අපනයන බැංකුව (Export-Import Bank of India), චීන සංවර්ධන බැංකුව (China Development Bank) සහ දකුණු අප්‍රිකා සංවර්ධන බැංකුව (Development Bank of Southern Africa) ඇතුළත් විය. මේ අනුව බ්‍රික්ස් රටවල් අතර හුවමාරුවල දී ජාත්‍යන්තර සංචිත මුදලක් ලෙස එක්සත් ජනපද ඩොලරයට මෙතෙක් හිමිව තිබුණු බලය හීන කෙරෙනු ඇත. පූර්ණ පරිවර්ත්‍යතාවෙන් යුත් එක්සත් ජනපද ඩොලරය වැනි මුදල් මත රඳා පැවැත්ම අඩු කිරීම සහ බ්‍රික්ස් රටවල් අතර අන්තර් ජාතික වෙළෙඳාමේ හුවමාරු පිරිවැය අඩුකිරීමට උපකාරීවීම මෙම ගිවිසුම් මඟින් අපේක්ෂිත ය. වෙළෙඳාම සම්බන්ධ මෙම පියවර මඟින් පසුගිය වසරේ ඩොලර් බිලියන 230ක් වූ බ්‍රික්ස් රටවල් අතර වෙළෙඳාම 2015 වන විට ඩොලර් බිලියන 500ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙ සේ වෙළෙඳාමේ දී එක්සත් ජනපද ඩොලර් වෙනුවට ඒ ඒ රටවල ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා යොදා ගැනීමට ගිවිසුම් අත්සන් කිරීම මඟින් ලෝක මූල්‍ය ක්‍රමය තුළ බ්‍රික්ස් හවුලේ කාර්යභාරය පුළුල් කිරීමට ඔවුන් ගේ ඇති සූදානම තහවුරු කළහ.

එ මෙන් ම සාමාජික රටවල් එක් ව ලෝක බැංකුව හෝ ආසියානු සංවර්ධන බැංකුව හෝ ස්වරූපයේ විකල්ප ණය දෙන්නෙක් ලෙස සංවර්ධන බැංකුවක් පිහිටුවීම පිළිබඳ ව සලකා බැලීමට එකඟවීම ද සිවුවන බ්‍රික්ස් සමුළුවේ සුවිශේෂී සිදුවීමකි. බ්‍රික්ස් බැංකුව පිහිටුවීමට ඇති ශක්‍යතාව පිළිබඳ සොයා බලා මීළඟ සමුළුවට පෙර ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම බ්‍රික්ස් රටවල මුදල් ඇමතිවරුන්ට පැවරිණි. යෝජිත දකුණු - දකුණු නව සංවර්ධන බැංකුව මගින් බ්‍රික්ස් රටවල් සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින හා අඩු සංවර්ධිත රටවල සංවර්ධන සහ යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සහ ණය සම්පාදනය කිරීමට අපේක්ෂිත ය. සිව්වන සමුළුවේ වැදගත් ම කටයුත්ත වුයේ මෙම බ්‍රික්ස් බැංකුව පිළිබඳ එකඟතාවයි. එය කණ්ඩායමේ පළමු ආයතනය ද වෙයි. යෝජිත බැංකුව පිළිබඳව සහ ඉන් ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳ විශේෂයෙන් ම චීන අරමුදල් සම්බන්ධව අප්‍රිකානු රටවල් ඉමහත් අපේක්ෂාවෙන් සිටින බව දකුණු අප්‍රිකානු ජනාධිපති ජේකබ් සූමා (Jacob Zuma) පවසයි.

**BRICS වගතුග - රුසියාව**



**ජනගහනය**
මිලියන 143.10
ලෝක ජනගහනයෙන් 2.04%
ලෝකයේ 8 වැනි තැන

**භූමි ප්‍රමාණය**
වර්ග කි.මී. 17,098,242
ලෝකයේ 1 වැනි තැන

**නාමික ද.දේ.නි. (2011)**
එ.ජ.ඩො. මිලියන 1,850,401
ලෝකයේ 9 වැනි තැන

**ද.දේ.නි. (2050)**
එ.ජ. ඩොලර් බිලියන 8,580
ලෝකයේ 6 වැනි තැන

**විදේශ සංචිත**
එ.ජ.ඩො. මිලියන 524,370
ලෝකයේ 4 වැනි තැන

**අයවැය හිඟය**
එ.ජ.ඩො. මිලියන 80,000
ලෝකයේ 11 වැනි තැන

**රාජ්‍ය ණය**
ද.දේ.නිෂ්පාදනයෙන් 9.60%

**ජංගම ගිණුම අතිරික්තය**
එ.ජ.ඩො. මිලියන 90,510
ලෝකයේ 4 වැනි තැන

ඩොලරය හිමිකරගෙන ඇති අධිපති බලය අඩුකිරීම සඳහා විකල්ප ලෝක සංචිත මුදලක් පිළිබඳව බ්‍රික්ස් සංවිධානය එහි ආරම්භයේ සිට ම අවධානය යොමුකර ඇත. පවත්නා ලෝක මූල්‍ය ක්‍රමය සහ ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතන නැවත ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ මෙහි දී බ්‍රික්ස් නායකයෝ අවධාරණය කළහ. මෙම ආයතන පිහිටුවා මේ වන විට අවුරුදු 60 කටත් වඩා කල් ගත වී ඇත. අද ලොව පවතින්නේ එම සංවිධාන ස්ථාපිත කරන ලද අවස්ථාවේ පැවති පරිසරය නො වේ. කාලීන සහ වෙනස් වන අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස මෙම ආයතන දෙක වෙනස් වී නොමැති බැවින් ඒවා කඩිනමින් ප්‍රතිසංවිධානය කළ යුතු බව බ්‍රික්ස් සිව්වන රාජ්‍ය නායක සමුළුවට සහභාගි වූ ඉන්දීය අගමැති මන්මෝහන් සිං ප්‍රකාශ කළේය.

එ මෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ඡන්ද බලය වැඩිකළ යුතු බවටත් ලෝක ආර්ථික ස්ථායීතාවට අහිතකර ආකාරයේ උද්ධමනීය මුදල් ප්‍රතිපත්ති අනුගමනය නො කරන ලෙසටත් බ්‍රික්ස් නායකයෝ බටහිර රටවලට බල කළහ. අධි ද්‍රවශීලතාව තුළින් ලෝක ආර්ථිකය අස්ථාවර කිරීම පිළිබඳව ඔවුහු ධනවත් රටවලට දෝෂාරෝපණය කළහ.

ලෝක බැංකුවෙහි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ඡන්දය භාවිතා කිරීමේ ක්‍රමය අනුව වැඩි බලයක් හිමිවන්නේ එක්සත් ජනපදයට සහ යුරෝපීය රටවලට ය. 2010 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිසංස්කරණය කළ පසු ව පවා සෙසු රටවලට හිමි ඡන්ද බලය සියයට 13 කට සීමා වී පවතියි. මේ අනුව ලෝක ජනගහනයෙන් අඩකටත් වඩා නියෝජනය කරන පාර්ශ්වයෙහි එ නම්

බිලියන 3 ක් පමණ නියෝජනය කරන පාර්ශ්වයෙහි තේරීම, මනාපය නිෂ්ප්‍රභා කෙරේ. මේ නිසා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් කෙරෙහි මෙම ආයතන විසින් ඇති කරනු ලබන බලපෑම්, යෝජනා සහ කොන්දේසි එම රටවලට හිතකර ඒවා නොවන අවස්ථාවල දී වුවත් ඒවාට එරෙහි ව ප්‍රබල හඬක් නැඟීමට හැකියාවක් මෙම ආයතන රාමුව තුළ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට නැත. එම නිසා දැනට පවත්නා ජාත්‍යන්තර මූල්‍ය විධි ක්‍රමය තුළ සංවර්ධනය වෙමින් පවත්නා රටවල නියෝජනය සහ හඬ ඉහළ නැංවීමේ අවශ්‍යතාව පිළිබඳවත් සියලු දෙනාට ම සාධාරණ වන මූල්‍ය ක්‍රමයක් පිහිටුවීමට සහ වැඩි දියුණු කිරීම පිළිබඳවත් දිල්ලි ප්‍රකාශනය මඟින් බ්‍රික්ස් නායකයෝ අවධාරණය කරති. නැඟී එන ආර්ථික, ලෝක ආර්ථික වර්ධනයේ ගාමක බලවේගයයි. ලෝක ආර්ථික වර්ධනයට බ්‍රික්ස් රටවල දායකත්වය සියයට 50 ඉක්මවයි. මේ නිසා ලෝක ආර්ථිකය කෙරෙහි නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් විසින් දක්වන දායකත්වයේ තරම මනාව නියෝජනය වන අයුරින්, පිළිබිඹුවන අයුරින් පංගු වර්ගීකරණය පූර්ණ වශයෙන් සංශෝධනය කළ යුතු බව ඔවුහු අවධාරණය කරති.

ආරම්භයේ පටන් ම ලෝක බැංකුවෙහි අධිපති තනතුරට පත් කරනුයේ ඇමෙරිකානු ජාතිකයෙකි. එ මෙන් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මුල් පුටුව යුරෝපීය ජාතිකයෙකුට හිමි විය. මෙම තත්ත්වය වෙනස් කළ යුතු බවට කලක පටන් නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අදහස් දක්වයි. ඉතිහාසයෙහි පළමු වරට මෙම තනතුර උදෙසා ඇමෙරිකන් නොවන අපේක්ෂකයින් ගේ ඉදිරිපත් වීමක් 2012 වසරේ වාර්තා විය. 2011 දී ලෝක බැංකු අධිපති තනතුර සඳහා පත් කිරීමේ දී විනිවිදභාවයෙන් යුත් තනතුරට යෝග්‍යතාව පදනම් කරගත් ක්‍රමයක් අනුගමනය කිරීමට සාමාජිකයෝ 187 දෙනා ඒකමතිකව එකඟත්වයට පැමිණියහ. එහෙත් මෙහි දී අදාළ තනතුර සඳහා වඩාත් සුදුසුකම් සහිත වූ නයිජීරියා මුදල් ඇමතිනී න්ගෝසි ඔකොන්ජෝ-ඉවේලා (Ngozi Okonjo-Iweala) වෙනුවට ඇමෙරිකාව විසින් නම් කරන ලද ජිම් යොං කිම් (Jim Yong Kim) පත් වූ අතර එම පත් කිරීම බොහෝ දෙනෙකු ගේ විවේචනයට බඳුන් විය.

**BRICS වගතුග - ඉන්දියාව**



**ජනගහනය**
මිලියන 1,210.19
ලෝක ජනගහනයෙන් 17.24%
ලෝකයේ 2 වැනි තැන

**භූමි ප්‍රමාණය**
වර්ග කි.මී. 3,166,414
ලෝකයේ 7 වැනි තැන

**නාමික ද.දේ.නි. (2011)**
එ.ජ.ඩො. මිලියන 1,676,143
ලෝකයේ 11 වැනි තැන

**ද.දේ.නි. (2050)**
එ.ජ. ඩොලර් බිලියන 37,668
ලෝකයේ 3 වැනි තැන

**විදේශ සංචිත**
එ.ජ.ඩො. මිලියන 294,397
ලෝකයේ 9 වැනි තැන

**අයවැය හිඟය**
එ.ජ.ඩො. මිලියන 84,600
ලෝකයේ 10 වැනි තැන

**රාජ්‍ය ණය**
ද.දේ.නිෂ්පාදනයෙන් 68.05%

**ජංගම ගිණුම හිඟය**
එ.ජ.ඩො. මිලියන 62,960
ලොව 7 වැනි විශාලතම හිඟය

අවුරුදු පහක් තිස්සේ ඇතිවූ ලෝක මූල්‍ය අර්බුදය පිළිබඳව ද නව දිල්ලි සමුළුවේ දී සාකච්ඡාවට ගැණිනි. ලෝක ආර්ථිකය අස්ථාවර කිරීම පිළිබඳ ව මෙහිදී ඔවුහු ධනවත් රටවලට චෝදනා කළහ. ලෝක අධි ද්‍රවශීලතාවක් ඇතිවීම වැළැක්වීමටත් අත්‍යාවශ්‍යයෙන් ම රැකියා ජනනය කරන ආකාරයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතිකරනු පිණිසත් එම රටවල සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති පිහිටුවා ඒවාට අනුගත ව ක්‍රියාකිරීමේ වගකීම අනිවාර්යයෙන් ම කළ යුතු බව අවධාරණය කෙරිණි.

මෙම සමුළුවේ දී සාකාච්ඡාවට ගැනුනේ බ්‍රික්ස් රටවල් හා සම්බන්ධිත ආර්ථික හා මූල්‍ය කරුණු පමණක් නො වේ. ලෝක සාමයට බලපාන කරුණු කෙරෙහි ද අවධානය යොමු විය. ඒ අනුව හිතකර සාමකාමී කටයුතු සඳහා ඉරානයට න්‍යෂ්ටික බලශක්තිය භාවිතයට ඇති අයිතිය පිළිබඳව බ්‍රික්ස් රටවල් එකඟ වූහ. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා මාර්ගයෙන් මෙම ගැටලුවට විසඳුම් සෙවිය යුතු බවට ද ඔවුහු එකඟවූහ.

සිරියාව පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ද ඊට සම්බන්ධ සියලුම පාර්ශ්ව මානව හිමිකම් කඩ කෙරෙන ක්‍රියාවලින් ඈත්විය යුතු බවත් එහි ආණ්ඩුව මූලික වන දේශපාලන ක්‍රියාවලියකින් පමණක් ගැටලු විසඳා ගත යුතු බවටත් මෙහි දී අවධාරණය කළහ.

බ්‍රික්ස් සංවිධානය ආරම්භ කළ දින පටන් වසරක් පාසා එහි සමුළු පවත්වන ලද ද ඉන් ලබාගත් ප්‍රතිඵලයක් නොමැති බැවි ද එය බ්‍රික්ස් නමට පමණක් සීමා වී ඇති බැවි ද ඇතැම් බටහිර මාධ්‍ය විසින් හුවා දක්වනු ලබයි. ඔවුහු බ්‍රික්ස් සංවිධානය ලොව මහා බලවතුන් ලෙස පෙනී සිටින ඇමෙරිකාව ප්‍රමුඛ බටහිරට එරෙහිව ඉදිවන දැවැන්ත පවුරක් ලෙස දකිති. මේ නිසා බ්‍රික්ස් සංවිධානයේ අවපක්ෂය ම දකිති. මීට වසර හැට ගණනකට එ පිට බ්‍රෙට්න්වුඩ්ස් සමුළුවට සහභාගීවූවෝ එකම මතයක් දැරුවෝ නොවූහ. එක ම පිලක් නියෝජනය කළෝ ද නොවූහ. එහෙත් එ වකට ලෝක ආර්ථිකය වැටී තිබුණු අගාධයෙන් ගොඩ ගැනීමට ඔවුහු යම් යම් එකඟතාවලට පිළිපන්හ. ඒ ආකාරයෙන් ම බ්‍රික්ස් රටවලට ද ඒ ඒ රටවලට විශේෂිත වූ මතවාද තිබිය හැකිය. එහෙත් මේ වන විටත් ඔවුහු දේශීය මුදලින් ගනුදෙනු කළ හැකි

ආකාරයේ ක්‍රමයක් ජනිත කිරීම තුළින් වසර ගණනාවක් පුරා පවත්වාගෙන ආ ඩොලරය පදනම් කරගත් විනිමය රටාව වෙනස් කිරීමට පියවර ගෙන ඇත. චීනය සහ රුසියාව මෑත වර්ෂවල තම සංචිත තුළ එක්සත් ජනපද ඩොලරයේ නියෝජනය අඩු කරමින් වෙනත් ආයෝජන කෙරෙහි යොමුවී ඇත.

චීන සමාජ විද්‍යා අධ්‍යයනායතනයෙහි (Chinese Academy of Social Sciences - CASS) පර්යේෂක සුං හුං (Song Hong) පවසන පරිදි බ්‍රික්ස් රටවල් සියල්ල ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ය. ඔවුනට විසඳා ගැනීමට ඇති ගැටලු එක හා සමාන ය. ආර්ථික ව්‍යුහය, යටිතල පහසුකම්, මූල්‍ය වෙළෙඳපොළ සහ සංවර්ධනයේ අසමතුලතාව ඒ සඳහා උදාහරණ වෙයි. එකිනෙකාට උපකාර කිරීම සඳහා ඔවුනොවුන් සතු අතිරේක මුදල් සහ සම්පත් යෙදවීමෙන් සාමාජිකයන්ට වඩාත් පල ලැබිය හැකිය. එ මතු නොව ශක්තිමත් මූල්‍ය සහයෝගීතාවක් තුළින් මූල්‍ය අර්බුද හමුවේ වුවත් නොසැලී සිටිමින් ස්ථිර සහ මනා සංවර්ධනයක් අත්කර ගැනීමට බ්‍රික්ස් රටවලට හැකියාව ඇත. එ මෙන් ම වර්තමාන අන්තර්ජාතික මූල්‍ය ක්‍රමයේ ඇති අඩුපාඩු මඟහරවාලීම සඳහා බ්‍රික්ස් ක්‍රමවේදය පූර්වාදර්ශයක් කරගත හැකිය. ණය ගනුදෙනු සඳහා ඒ ඒ රටවල දේශීය මුදල් යොදා ගැනීම හා ව්‍යවහාර මුදල් හුවමාරු ක්‍රමයක් ස්ථාපිත කිරීම තුළින් බ්‍රික්ස් සාමාජිකයන්ට ඩොලරය පිළිබඳ තබා ඇති අධි විශ්වාසය අඩුකර ගැනීමටත් වෙළෙඳාමේ අවදානම අඩුකරගැනීමටත් අවස්ථාව සැලසේ. වඩාත් සාධාරණ ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් බිහිකිරීමට බ්‍රික්ස් රටවල සහයෝගය ඉවහල් වනු ඇත. සුං පවසන පරිදි වත්මන් ලෝක මූල්‍ය ක්‍රමයෙහි බොහෝ ගැටලු පවතී. උදාහරණයක් වශයෙන් සංවර්ධිත රටවලට සාපේක්ෂ ව ප්‍රබල හඬක් නැඟීමේ ශක්තියක් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සතු නො වේ. මේ නිසා සංවර්ධනය වෙමින් පවත්නා ප්‍රධාන රටවල තත්ත්වය ඉහළ නැංවීමට ද සාධාරණ සහ ශක්තිමත් ලෝක ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතනවලට බලපෑම් කිරීමට ඔවුනට ඇති හැකියාව ඉහළ නැංවීමට ද බ්‍රික්ස් රටවල් එක්ව ක්‍රියා කළ යුතු ය.

**BRICS වගතුග - චීනය**



**ජනගහනය**
මිලියන 1,347.35
ලෝක ජනගහනයෙන් 19.2%
ලෝකයේ 1 වැනි තැන
**භූමි ප්‍රමාණය**
වර්ග කි.මී. 9,596,961
ලෝකයේ 3 වැනි තැන
**නාමික ද.දේ.නි. (2011)**
එ.ජ.ඩො. මිලියන 7,298,147
ලෝකයේ 2 වැනි තැන
**ද.දේ.නි. (2050)**
එ.ජ. ඩොලර් බිලියන 70,710
ලෝකයේ 1 වැනි තැන
**විදේශ සංචිත**
එ.ජ.ඩො. මිලියන 3,305,000
ලෝකයේ 1 වැනි තැන
**අයවැය හිඟය**
එ.ජ.ඩො. මිලියන 121,000
ලෝකයේ 7 වැනි තැන
**රාජ්‍ය ණය**
ද.දේ.නිෂ්පාදනයෙන් 25.84%
**ජංගම ගිණුම අතිරික්තය**
එ.ජ.ඩො. මිලියන 280,600
ලෝකයේ 1 වැනි තැන

බ්‍රික්ස් පිළිබඳ පර්යේෂණ අධ්‍යයන කටයුතුවල නියැලෙන චීන සමාජ විද්‍යා අධ්‍යයනායතනයෙහි පර්යේෂකයකු වන ලී චුංමින් (Li Zhongmin) බ්‍රික්ස් සාමාජිකයන් අතර සහයෝගීතාව තවමත් ප්‍රාථමික මට්ටමේ තිබුණේ වුව ද යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා මූල්‍යකරණය, ව්‍යවහාර මුදල් ජාත්‍යන්තරකරණය, මූල්‍ය ණය, එකිනෙක රට අතර කෙරෙන ආයෝජන, වෙළෙඳ කටයුතු පහසුකිරීමට පියවර ගැනීම වැනි විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳව එකඟතාවට එළැඹීම ඉතා වැදගත් බව පවසයි. ඔහු අදහස් කරන පරිදි මෙම ගිවිසුම් බ්‍රික්ස් හි අනාගත සංවර්ධනය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇතිකරනු ඇත.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ චීන අධ්‍යයන ආයතනයේ (China Institute of International Studies) සභාපති ජු ෂිං (Qu Xing) පවසන පරිදි, බ්‍රික්ස් රටවල් දකුණු - දකුණු සහයෝගය වර්ධනය කිරීමට සහ ලෝක බැංකු යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කළ ද එය ඉතා කඩිනමින් කළ හැකි කටයුත්තක් නො වේ. බටහිර රටවල් බ්‍රික්ස් රටවල මෙම උත්සාහය ලෝක බැංකුවට කරන අභියෝගයක් ලෙස දකිති. එම උත්සාහය දේශපාලනීකරණය කරති. ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ බ්‍රික්ස් සංවර්ධන බැංකුවෙහි සම්බන්ධතාව නිශ්චිත ව නිර්වචනය කිරීම සංකීර්ණ මෙන් ම දිගු කාලයක් ගතවිය හැකි බව ජු ෂිං පවසයි.

2011 දෙවන භාගයේ යුරෝපීය රටවල් සහ ඇමෙරිකා එක්සත් ජනපදය ඔවුන් ගේ ණය අර්බුදයට ප්‍රතිචාර දක්වමින් බ්‍රික්ස් රටවල් ද ඇතුළත් ව සංවර්ධනය වෙමින් පවත්නා රටවලින් තම මුදල් නැවත ආපසු ඇදගැනීමට පටන් ගත්හ. බටහිර රටවල මෙම ප්‍රාග්ධනය ඇද ගැනීම සම්බන්ධයෙන් අද්‍යතන ජාත්‍යන්තර සබඳතා පිළිබඳ චීන ආයතනයෙහි (China Institutes of Contemporary International Relations) ලෝක ආර්ථික අධ්‍යයන ආයතනයේ (Institute of World Economic Studies) අධ්‍යක්ෂ ඡන් ෆංයිං (Chen Fengying) බ්‍රික්ස් සාමාජිකයින්ට අනතුරු අඟවයි. බටහිර රටවල ණය අර්බුදය විසින් පසුගිය වසරෙහි ලෝක ආර්ථිකය අපහරණය කළ බව ද ඇය පවසයි. මේ නිසා 2012 දී බ්‍රික්ස් රටවල් බටහිර අර්බුදයේ ගොදුරු බවට පත් නො වී සිටීමට අවධානය

යොමු කළ යුතු වේ. උද්ධමනය හෝ මුදල් අවප්‍රමාණය කිරීම හෝ හරහා බටහිර රටවල් ඔවුන් ගේ ණය අර්බුදය නැඟී එන ආර්ථික මතට පැටවීමට දරන උත්සාහය පිළිබඳව බ්‍රික්ස් රටවල් අවධානයෙන් පසුවිය යුතු බව ඇය පවසයි.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳ චීන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ලියු කු-ඡං (Liu Guchang) පවසන පරිදි ලෝක ආර්ථිකය පාලනය කරන සංවර්ධිත රටවල් හා නැඟී එන ආර්ථිකවල බලය වර්ධනය වීම පිළිබඳ ගැටලුව එන්න එන්න ම තියුණු වෙයි. බටහිර නිරතුරුව නැඟී එන ආර්ථික හා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට බාධා පමුණුවයි. වර්තමානයේ පවත්නා ජාත්‍යන්තර ආර්ථික සහ මූල්‍ය ක්‍රම භාවිතා කරමින් ඒවායේ අර්බුද මේ රටවල් දෙසට හරවයි. ලෝක ආර්ථිකය අයාලේ යා නො දී නිසි මගට ගැනීමත් ශක්තිමත් කිරීමත් බ්‍රික්ස් රටවල මෙන් ම නැඟී එන ආර්ථිකවල යුතුකමක් වේ. එ මෙන් ම එය හදිසි අවශ්‍යතාවක් ද වේ. එය අනිවාර්යයෙන් ම කළ යුත්තක් ද වේ. ලෝක පාලනය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රතිලාභ බ්‍රික්ස්වලට පමණක් නො වේ. සමස්ත ලෝක ආර්ථිකයේ වර්ධනයට මෙන් ම එය යථා තත්ත්වයට පත්වීමට ද හේතුවේ යැයි ලියු කූ-ඡං පවසයි.

හරිත ආර්ථිකය සංවර්ධනය කිරීමට මුවා වී පනවනු ලබන වෙළෙඳ හා ආයෝජන බාධකවලට ද බ්‍රික්ස් නායකයෝ දිල්ලි ප්‍රකාශනය මඟින් විරුද්ධත්වය පළකර ඇත. එ මෙන් ම සෑම ජාතියකට ම සිය ප්‍රමුඛතා, ජාතික උපාය මාර්ග, එකිනෙක රටවල සංවර්ධන මට්ටම ආදිය පදනම්වන ස්ථායී ආර්ථික සංවර්ධනයක් සඳහා සිය ආර්ථික මාර්ගය තීරණය කිරීමට ඇති අයිතිය පිළිබඳව ඔවුහු අවධාරණය කරති. මෙම එකඟතා පිළිබඳ අදහස් දක්වන ලියු කූ-ඡං ලෝක මූල්‍ය ක්‍රමය හා ජාත්‍යන්තර බලය ප්‍රතිසංවිධානය කිරීමෙහි ලා බ්‍රික්ස් රටවල් අද්විතිය ස්ථානයක් උසුලන බව පවසයි. එහෙත් බ්‍රික්ස් රටවල් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම යනු සංවර්ධිත රටවල් සමඟ ගැටීම නොවන බවත් ඉතා ම සුදුසු වන්නේ දකුණ සහ උතුර සහයෝගයෙන් කටයුතු කිරීම මිස ගැටුම් ඇතිකර ගැනීම නොවන බවත් ඔහු පවසයි.

දිල්ලියෙහි පැවති බ්‍රික්ස් සමුළුව මඟින් සාමාජික රටවල් අතර

### BRICS වගතුග - දකුණු අප්‍රිකාව



**ජනගහනය**
මිලියන 50.59
ලෝක ජනගහනයෙන් 0.72%
ලෝකයේ 24 වැනි තැන

**භූමි ප්‍රමාණය**
වර්ග කි.මී. 1,221,037
ලෝකයේ 25 වැනි තැන

**නාමික ද.දේ.නි. (2011)**
එ.ජ.ඩො. මිලියන 408,074
ලෝකයේ 29 වැනි තැන

**විදේශ සංචිත**
එ.ජ.ඩො. මිලියන 50,680
ලෝකයේ 36 වැනි තැන

**අයවැය අතිරික්තය**
එ.ජ.ඩො. මිලියන 550
ලෝකයේ 9 වැනි තැන

**රාජ්‍ය ණය**
ද.දේ.නිෂ්පාදනයෙන් 38.77%

**ජංගම ගිණුම හිඟය**
එ.ජ.ඩො. මිලියන 9,987
ලොව 16 වැනි විශාලතම හිඟය

ගනුදෙනුවල දී ඒ ඒ රටවල මුදල් භාවිතයට පියවර ගැනීම චීන ව්‍යවහාර මුදල් ඒකකය වන යුවාන් ජාත්‍යන්තරකරණය කිරීමේ පියවරක් ලෙස ඇතැමෙක් දකිත්. මෙය කලක් තිස්සේ ජාත්‍යන්තර දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රයේ කතාබහට ලක්වෙමින් පවතී. මේ පිළිබඳව සඳහන් කිරීමේ දී බටහිර මාධ්‍ය යුවාන් හැඳින්වීමට රතු ඩොලරය (Red Buck) යන්න වහරයි. කෙ සේ වෙතත් යුවාන් ජාත්‍යන්තරකරණය වීම ක්ෂණිකව සිදු වේ යැයි අපේක්ෂා කළ හැක්කක් නො වේ.

2010 මුල ලෝක විදේශ විනිමය සංචිතයට එක්සත් ජනපද ඩොලරය සියයට 65 කින් ද යුරෝ සියයට 25 කින් ද බ්‍රිතාන්‍ය පවුම සහ යෙන් සියයට 3.5 බැගින් ද දායක විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ චීන සංවර්ධන පර්යේෂණායතනය (China's Development Research Center of the State Council) මෑතක දී ප්‍රකාශයට පත්කරන ලද China 2030: Building a Modern, Harmonious and Creative High Income Society වාර්තාවට අනුව 2025 වන විට චීන යුවාන් ජාත්‍යන්තර මුදලක් බවට පත්වෙයි. එය 2035 වන විට ලෝක විදේශ විනිමය සංචිතයට සියයට 12 කින් දායකවනු ඇතැයි ගණන් බලා ඇත.

බ්‍රික්ස් හවුලට ඇත්තේ ඉතා කෙටි ඉතිහාසයක් වුවත් මෙම රටවල එක්වීම දැනටමත් සාමාජික රටවලට බෙහෙවින් වෙළෙඳ සහ ආයෝජන අවස්ථා සලසා දී ඇත. පසුගිය වසරෙහි දකුණු අප්‍රිකාව සහ ඉන්දියාව අතර ඩොලර් බිලියන 11ක් වූ වෙළෙඳාම 2015 වන විට ඩොලර් බිලියන 15 ක් වනු ඇතැයි අපේක්ෂිත ය.

බ්‍රික්ස් රටවල් එකිනෙක අතර කෙරෙන විදේශ වෙළෙඳාමේ ප්‍රධාන හවුල්කරු බවට පත් ව ඇත්තේ චීනයයි. චීන රේගු සංඛ්‍යාන තොරතුරු සේවාව (China Customs Statistics Information Service) ට අනුව 2011 දී චීනය හා බ්‍රික්ස් රටවල් අතර වෙළෙඳ ගනුදෙනුවල වටිනාකම ඩොලර් බිලියන 282.7 ක් විය. මෙය බ්‍රසීලය සමඟ ඩොලර් බිලියන 84.2 ක්, රුසියාව සමඟ ඩොලර් බිලියන 79.2 ක්, ඉන්දියාව සමඟ ඩොලර් බිලියන 73.9 ක් සහ දකුණු අප්‍රිකාව සමඟ ඩොලර් බිලියන 45.4 ක් විය. මෙය චීනයේ ප්‍රධානතම වෙළෙඳ හවුල්කරුවන් වන ඇ.එ. ජනපදය, ජපානය, කොරියාව සහ ජර්මනිය සමඟ

කෙරන වෙළෙඳ ගනුදෙනුවල වටිනාකම හා සාපේක්ෂව ගත් විට විශාල වෙනසක් දැකිය හැකි වුවත් 2011 වසරේ දී චීනය හා බ්‍රික්ස් රටවල් අතර වූ වෙළෙඳාමේ වර්ධනයක් දැකිය හැකිය. 2011 දී චීනයේ විදේශ වෙළෙඳාමේ වර්ධනය සියයට 22.5ක් වූ අතර බ්‍රසීලය, රුසියාව සහ දකුණු අප්‍රිකාව සමඟ වෙළෙඳාම පිළිවෙලින් සියයට 34.5, 42.7 සහ සියයට 76.6 කින් ඉහළ ගොස් ඇත.




**ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති 2012 BRICS සමුළුව මුල් කරගෙන පළ කර තිබූ කාටූන් චිත්‍රයක්.**

චීනයේ බ්‍රික්ස් රටවල් සම්බන්ධ ආයෝජන තත්ත්වයේ ද මේ හා සමාන ස්වරූපයක් දක්නට ලැබේ.

2010 රුසියාවෙහි චීන ආයෝජනය ඩොලර් මිලියන 567 ක් වූ අතර බ්‍රසීලයෙහි ඩොලර් මිලියන 487 ක් සහ දකුණු අප්‍රිකාවෙහි ඩොලර් මිලියන 411 ක් විය. බ්‍රික්ස් සාමාජික රටවලින් ඉන්ධන සහ ඛනිජ ආනයනය කරන රටවල් අතුරින් චීනය ප්‍රධාන වේ. චීනය ඉන්දියාවෙන් සහ බ්‍රසීලයෙන් යපස් ද රුසියාවෙන් තෙල් ද ආනයනය කරයි.

ජිම් ඕනීල්ට අනුව පසුගිය දස වසර තුළ බ්‍රික් රටවල (එ නම්, දකුණු අප්‍රිකාව හැර) ද.දේ.නි. ඩොලර් ට්‍රිලියන 3 සිට ට්‍රිලියන 13 දක්වා වර්ධනය වී ඇත. එය තවත් එක්සත් ජනපද ආර්ථිකයක් නිර්මාණය වූවා හා සමාන බව ඔහු පවසයි. එය මෙම දශකයේ ඩොලර් ට්‍රිලියන 16 ඉක්මවා යනු ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. මේ සඳහා MIST (මෙක්සිකෝව, ඉන්දුනීසියාව, දකුණු කොරියාව හා තුර්කිය) රටවල ද දායකත්වය ලැබුණ හොත් එය එම කාල පරිච්ඡේදය තුළ ම එක්සත් ජනපදය හා යුරෝපීය හවුලෙහි දායකත්වය එක් ව ගත් විට එහි දෙගුණයකටත් වඩා ඉහළ අගයක් ගනු ඇති බව ඕනීල් පවසයි. ලෝක ආර්ථික වර්ධනය ඉදිරියට, ඉහළට ගෙන යන ශක්තිය ඇත්තේ වර්ධනය වන වෙළෙඳපොළට (ඕනීල් ගේ නවතම කෘතිය වන The Growth Map හි ඔහු Emerging Market යන්න වෙනුවට Growth Market යන්න භාවිතා කර ඇත.) බව ඔහු ගේ මතයයි.

නවදිල්ලි සමුළුව අවසානයේ චීන ජනාධිපති හූ චින්තාඕ නැඟී එන වෙළෙඳපොළ සහ ආර්ථික වේගවත් ආර්ථික වර්ධනයක් අත්පත් කරගෙන ඇති බවත් මේවා ලෝක සාමය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය බලයක්, බලවේගයක් බවට පත්වෙමින් තිබෙන බවත් මාධ්‍යවේදීන් හමුවේ පැවසුවේ ය. මෙ සේ ශක්තිමත් පදනමක් සහිත සංවිධානයක් පිහිටුවා ගැනීම තුළින් බ්‍රික්ස් රටවල් ලෝක ආර්ථිකය තුලිත කිරීමට, අන්තර්ජාතික සහයෝගීතාව, ලෝක පාලනය සහ සාමය සඳහා අත්‍යවශ්‍ය රටවල් බවට පත් ව තිබේ.✪

# බහුමාන

# දරිද්‍රතා දර්ශකය

**කමල් මුණසිංහ**

ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

දරිද්‍රතාව යනු සෑම සමාජයක් ම මුහුණ දෙන ප්‍රධාන ආර්ථික සහ සමාජයීය ගැටලුවකි. එබැවින් සෑම ආර්ථිකයක ම මූලික අරමුණක් වන ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමේ දී දරිද්‍රතාව දුරු කර දැමීම අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස සැලකේ. ජීවත්වීම සඳහා සපුරා ගත යුතු අවම අවශ්‍යතා නොලැබී යාමේ තත්ත්වය දරිද්‍රතාව ලෙස සරල ව අර්ථ දැක්විය හැක. රටක දරිද්‍රතාව කොපමණ දැ යි විධිමත් ව මැන බැලීම පහසු කටයුත්තක් නො වන්නා සේ ම ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කිරීම සඳහා වූ දරිද්‍රතා මිනුම් සකස් කිරීම ද සංකීර්ණ කටයුත්තකි. දරිද්‍රතාව දුරලීම සඳහා ජාතික මෙන් ම ජාත්‍යන්තර මට්ටමේ වැඩසටහන් දියත් කිරීම සෑම රටක ම ප්‍රමුඛ කාර්යයක් වේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී දරිද්‍රතාව පිළිබඳ නිවැරදි දත්ත සහ තොරතුරු පැවතීම අවශ්‍ය වේ. එ සේ ම දරිද්‍රතාව නිවැරදි ව අර්ථකථනය කිරීමත් නිරවුල් ව මැන බැලීමත් අත්‍යවශ්‍ය වේ. මෙම කාර්යයේ දී ලෝක සංවිධාන සහ ලොව පුරා සිටින විද්වතුන් විසින් කලින් කලට අදාළ මිනුම් යාවත්කාලීන කිරීම හෝ නව මිනුම් හඳුන්වා දීම සිදු කෙරේ. කෙ සේ වෙතත් වර්තමානයේ දරිද්‍රතාව ජාතික ව සහ ජාත්‍යන්තර ව මිනීමේ දී පොදුවේ පිළිගැනෙන මිනුම් කිහිපයක් භාවිත වන අතර එම මිනුම් ද කාලයත් සමඟ නවීකරණය වනු දැකිය හැකි වේ. නිල දරිද්‍රතා රේඛාව හෙවත් එක් පුද්ගලයෙකුට ආහාර සහ ආහාර නො වන භාණ්ඩ පරිභෝජනය සඳහා අවශ්‍ය වන මූර්ත වියදම ගණන් බලා එම ප්‍රමාණය වියදම් කළ නො හැකි කුටුම්භ ප්‍රමාණය කොපමණ ද යන්න දර්ශකයක් ලෙස යොදා ගනිමින් මූලික වශයෙන් ජාතික දරිද්‍රතාව මැන බැලේ. අනිත් අතට දිනකට එක්සත් ජනපද ඩොලරයකට (2008 න් පසු ව ඩොලර් 1.25) අඩුවෙන් ආදායම් ලබන පුද්ගලයින් දුප්පත්කමින් පෙළෙන පුද්ගලයින් ලෙස සලකා ජාත්‍යන්තර ව දරිද්‍රතාව මැන බැලේ. ඉහළ ආදායම් ලබන රටවල් සඳහා මෙම අගය දිනකට ඩොලර් දෙකක් ලෙස සැලකේ. සෑම වසරක ම එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහන මගින් ඉදිරිපත් කෙරෙන මානව සංවර්ධන වාර්තාව මගින් ලෝක දරිද්‍රතා ඉමට පහළින් ඇති ජනගහනය රටවල් අනුව වර්ග කෙරේ. මෙම මිනුම් සහ ඒවායේ අන්තර්ගත කරුණු, ගණනය කරන ක්‍රමවේද සහ බර තැබීම් යනාදිය කාලයත් සමග වෙනස් වීමක් ද දැකිය හැකි වේ. මෙ ලෙස ජාත්‍යන්තර ව දරිද්‍රතාව මැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන නවතම මිනුමක් වනුයේ බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI - Multidimensional Poverty Index) යි. එය පිළිබඳ ව විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි.

මෙම දර්ශකය ඔක්ස්ෆර්ඩ් සරසවිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එක් ව ඉදිරිපත් කර ඇත. දරිද්‍රතාව ගණනය කිරීමේ දී පුද්ගල ආදායම පමණක් නො ව දුප්පත්කම සමඟ බැඳී ඇති වෙනත් කරුණු ද සලකා බැලීම මෙම නව මිනුමෙහි ප්‍රධාන ලක්ෂණය වේ. එ සේ සලකා බැලිය යුතු තවත් වැදගත් සාධක රැසක් පාදක කරගත් මිනුමක් මෙ මගින් සපයා දෙයි. දරිද්‍රතාව දෙස මාන කිහිපයකින් පැති කිහිපයකින් බැලීම මෙහි දී සිදුකර ඇත. පුද්ගල ජීවිතය දුකට/දුප්පත්කමට පත්කෙරෙන විවිධ විහිනතා (Deprivations) එ සේ නැතහොත් අහිමිවීම් සැලකිල්ලට ගැනීම මෙහි දී සිදු කෙරේ. ඇතැම් විට ආදායම වැඩි වූ පමණින් සෞඛ්‍ය, අධ්‍යාපනය හෝ ජීවන තත්ත්වයේ උසස්වීම පිළිබිඹු නො වෙතැ යි මෙම දර්ශකය ඉදිරිපත් කළ විද්වත්හු ප්‍රකාශ කරති. දරිද්‍රතාව සහ විහිනතා මිනීම සඳහා විවිධ දෘෂ්ටිකෝණවලින් එ දෙස බැලිය යුතු බව නොබෙල් සම්මානලාභී ආර්ථික විද්‍යාඥ අමර්ත්‍ය සෙන් විසින් ඉදිරිපත් කළ අදහස ඔස්සේ ඔක්ස්ෆර්ඩ් සරසවියේ පර්යේෂකයින් විසින් රටවල් 109 ක සමාජ දත්ත පදනම් කරගනිමින් මෙම දර්ශකය සකස් කර ඇත. බහුමානයකින් එක ප්‍රපංචයක් දෙස බැලීම වඩාත් සුදුසු බව මෙම පර්යේෂකයෝ පෙන්වා දෙති. මෙම දර්ශකයේ වැදගත්කම දැක්වීමට පාදක කර ගත හැකි එක් කරුණක් වන්නේ මානව දරිද්‍රතා දර්ශකය යටතේ ඇතැම් රටවල දුප්පත් යැ යි සලකන ලද ජනගහනයට වඩා වැඩි කොටසක් නව දර්ශකය යටතේ දුප්පත් ජනගහනය ලෙස සැලකීමට සිදුවීමයි. ඒ අනුව දැනට දරිද්‍රතාවෙන් යුතු යැ යි සැලකූ ජනගහනයට වඩා වැඩි ජනගහනයක් නව දර්ශකය යටතේ දුප්පත් කොටසට වැටේ. ඒ ඒ දරිද්‍රතා ලක්ෂණ හඳුනා ගැනීමටත් ඒවා අතර සම්බන්ධය විග්‍රහ කිරීමටත් මෙම දර්ශකය වැදගත් වේ. මීට අමතර ව රටවල් අතර ප්‍රදේශ අතර දරිද්‍රතා රටා හඳුනාගැනීමට,

ප්‍රතිපත්ති සම්පාදකයන්ට වඩාත් කාර්යක්ෂම ව ක්‍රියා කිරීමට අවශ්‍ය තොරතුරු මෙ මගින් සැපයේ. ඊට අමතර ව වඩාත් දුප්පත්/අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන කොටස තෝරා ගැනීමට හැකිවීමත් මෙම දර්ශකයේ විශේෂත්වයක් වේ. ඒ අනුව සියලු සංවර්ධන වැඩසටහන් නැවත සකස් කිරීමේ හෝ පුළුල් කිරීමේ අවශ්‍යතා ඇතුළු සාර්ව ආර්ථික තීරණ ගැනීමේ පිටිවහලක් මෙ මගින් සපයා තිබේ. මෙ මගින් රටවල් තුළ, රටවල් අතර සහ ලොව පුරා දුප්පත්කමේ ප්‍රමාණය මෙන් ම ස්වභාවය ද විස්තර කරයි.

**බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීම**

මෙ මගින් මාන තුනක් ඔස්සේ දරිද්‍රතාව විමසා බැලේ. සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ජීවන තත්ත්වය යන ඒවා ය. මෙම කරුණු තුන උප දර්ශක 10 ක් ඔස්සේ විමසා බලයි. ඒවා පහත සටහනේ පෙන්නුම් කෙරේ.

සැලකේ. බහුමාන දරිද්‍රතා දර්ශකය යටතේ දරිද්‍රතාව පිළිබඳ ව මිනුම් දෙකක් සැපයේ. ඒවා නම් ජනගහන දරිද්‍රතා දර්ශකය (Incidence or Head Count) සහ දරිද්‍රතා තීව්‍රතා දර්ශකය (Average Intensity of Deprivation) යි.

ඉහත දැක් වූ අහිමිවීම්/විහිනතා සියල්ල එක් කොට බර තැබීමෙන් පසු ව ලැබෙන බරිත එකතුවෙන් තුනෙන් එකක් (සියයට 33 කටවත්) ලක් වූ පිරිස මුළු ජනගහනයෙන් කො පමණ ප්‍රමාණයක් ද යන්න ජනගහන දරිද්‍රතා දර්ශකය යන මිනුමෙන් දැක් වේ. එනම්

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{බහුමාන වශයෙන් දරිද්‍රතාවට පත් ජනගහනය}}{\text{මුළු ජනගහනය}}$$

අනිත් අතට දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනය පත් වන විහිනතා ගෙන එය බර තබන ලද සාමාන්‍ය දරිද්‍රතාවෙන්

| | බහුමාන දරිද්‍රතා දර්ශකය MPI | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දරිද්‍රතා මිනුම් (02) | ජනගහන දරිද්‍රතා දර්ශකය සහ දරිද්‍රතා තීව්‍රතා දර්ශකය | | | | | | | | | |
| මාන (03) | ජීවන තත්ත්වය | | | | | | සෞඛ්‍යය | | අධ්‍යාපනය | |
| | (බර තැබීම 1/3x1/6=1/18 කි) | | | | | | (බර තැබීම 1/3x1/2=1/6 කි) | | | |
| දර්ශක (10) | වත්කම් | ආහාර පිළියෙළ කෙරෙන ඉන්ධන | ගෙබිම | වැසිකිලි පහසුකම් | පානීය ජලය | විදුලිය | පෝෂණය | ළදරු මර්ත්‍යතාව | පාසලට ගොස් ඇති බව | පාසල් ගිය වසර ගණන |
| | ගුවන් විදුලි යන්ත්‍රයක්, රූපවාහිනියක්, පා පැදියක්, යතුරුපැදියක් හෝ ශීතකරණයක් සහ මෝටර් රථයක් හෝ ට්‍රැක්ටරයක් යනාදියෙන් එකක් හෝ නො තිබීම | දර, අඟුරු හෝ අපද්‍රව්‍ය | අපිරිසිදු, වැලි සහිත හෝ අපද්‍රව්‍ය සහිත ගෙබිමක් පැවතීම | වැසිකිලි පහසුකම් ප්‍රමාණවත් පරිදි නොපැවතීම සහ/හෝ පිරිසක් විසින් එක වැසිකිලියක් භාවිත කිරීම | නිවසේ සිට මිනිත්තු තිහක් ඇතුළත ඇවිද යා හැකි දුරක පානීය ජලය පැවතීම | විදුලිය නොමැති බව | ඕනෑ ම වැඩිහිටියකු හෝ ළමයකු මන්දපෝෂණයෙන් පෙළෙන්නේ ද යන බව | පවුලේ යම් සාමාජිකයෙක් මරණයට පත් ව තිබීම | වයස අවුරුදු 1-8 අතර පාසල් යන වයසේ ළමුන් සිටින නමුත් පාසල් නොයාම | කුටුම්භයේ කිසිවෙක් වසර පහක්වත් පාසල් ගොස් නොමැති බව |

සෑම පුද්ගලයකුට ම අදාළ උප දර්ශක 10 සඳහා ලකුණු දීමක් සිදු කෙරේ. ඒ අනුව උපරිම ලකුණු 100 කි. අනෙක් අතට මාන තුන සඳහා සමාන බර තැබීමක් සිදු කෙරෙන අතර එක මානයකට අදාළව ලකුණු 33.3 (100/3) ක් ලැබේ. අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා දර්ශක දෙක බැගින් තිබෙන නිසා එක් දර්ශකයක් සියයට 16.7 (100x1/3x1/2) ක ලකුණු ප්‍රමාණයක් ලබයි. ජීවන තත්ත්වය පිළිබඳ මානයේ දී දර්ශක 6 ක් පවතින බැවින් බර තැබීම සියයට 5.6 (100x1/3x1/6) කි.

මෙම දර්ශකයේ මානවලින් යටත් පිරිසෙයින් තුනෙන් එකක ප්‍රමාණයකින් දක්වන විහිනතා වළක්වා ගත නො හැකි පුද්ගලයකු බහුමාන වශයෙන් දුප්පත් තැනැත්තෙක් ලෙස පෙළෙන ජනගහනයෙන් කො පමණ ප්‍රමාණයක් ද යන්න සලකා බැලීම දරිද්‍රතා තීව්‍රතා දර්ශකය මගින් දැක්වේ.

$$\text{දරිද්‍රතා තීව්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතාවෙන් යුතු පිරිස ලබා ගත් විහිනතා ලකුණුවල එකතුව}}{\text{දරිද්‍රතාවෙන් යුතු පිරිස}}$$

මෙම අගයන් දෙක ගුණ කිරීමෙන් තනි MPI අගයක් ලබා ගැනේ. මෙම ක්‍රමවේදය සබිනා අල්කිරේ (Sabina Alkire) සහ ජේම්ස් ෆොස්ටර් (James Foster) යන විද්වත් දෙපළ විසින් ඉදිරිපත් කරන ලද්දකි.

## බහුමාන දරිද්‍රතා දර්ශකයේ ප්‍රවණතා

2011 වසර වන විට මෙම දර්ශකය රටවල් 109 ක් සඳහා සකස් විය. ඒ මගින් ලෝක ජනගහනයෙන් සියයට 79 ක් හෙවත් ජනගහනය බිලියන 5.3 ක් ආවරණය කෙරේ. එම ප්‍රමාණයට දියුණු වෙමින් පවතින රටවල ජනගහනයෙන් සියයට 93 ක් අයත් වේ. එයින් සියයට 31 ක් හෙවත් බිලියන 1.65 ක ජනතාවක් දරිද්‍රතාවයෙන් පෙළේ. මෙම ජනගහනය ලෝක බැංකුව මගින් ඉදිරිපත් කෙරෙන ආදායම් දරිද්‍රතාව මැන බැලෙන ජන සංඛ්‍යාවට අනුව (දිනකට ඩොලර් 1.25

**1 වන සංඛ්‍යා සටහන**

### බහුමාන දරිද්‍රතා දර්ශකය

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ඉතා ඉහළ මානව සංවර්ධනය** | | | | | | | | | | | | | |
| 30 | අරාබි එක්සත් එමීර් රාජ්‍යය | 2003 | 0.002 | 0.6 | 20 | 35.3 | 2.0 | 0.0 | 0.1 | 0.1 | 0.0 | .. | .. |
| 38 | හංගේරියාව | 2003 | 0.016 | 4.6 | 466 | 34.3 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | .. |
| 45 | ආර්ජන්ටිනාව | 2005 | 0.011 | 3.0 | 1,160 | 37.7 | 5.7 | 0.2 | 0.2 | 2.2 | 2.2 | 0.9 | .. |
| 46 | ක්‍රොයේෂියාව | 2003 | 0.016 | 4.4 | 196 | 36.3 | 0.1 | 0.3 | 0.1 | 0.3 | 1.2 | 0.0 | 11.1 |
| **ඉහළ මානව සංවර්ධනය** | | | | | | | | | | | | | |
| 57 | මෙක්සිකෝව | 2006 | 0.015 | 4.0 | 4,313 | 38.9 | 5.8 | 0.5 | 0.6 | 2.1 | 2.8 | 3.4 | 47.4 |
| 59 | සර්බියාව | 2005 | 0.003 | 0.8 | 79 | 40.0 | 3.6 | 0.1 | 0.1 | 0.2 | 0.7 | 0.1 | 6.6 |
| 66 | රුසියාව | 2003 | 0.005 | 1.3 | 1,883 | 38.9 | 0.8 | 0.2 | 0.1 | 0.4 | 0.1 | 0.0 | 11.1 |
| 68 | කසකස්ථානය | 2006 | 0.002 | 0.6 | 92 | 36.9 | 5.0 | 0.0 | 0.3 | 0.1 | 0.5 | 0.2 | 15.4 |
| 80 | පීරු | 2004 | 0.086 | 19.9 | 5,421 | 43.2 | 16.9 | 6.0 | 14.1 | 19.4 | 19.2 | 5.9 | 34.8 |
| 84 | බ්‍රසීලය | 2006 | 0.011 | 2.7 | 5,075 | 39.3 | 7.0 | 0.2 | 1.0 | 1.1 | .. | 3.8 | 21.4 |
| 86 | ආර්මේනියාව | 2005 | 0.004 | 1.1 | 34 | 36.2 | 3.9 | 0.0 | 0.2 | 0.4 | 0.3 | 1.3 | 26.5 |
| 87 | කොලොම්බියාව | 2010 | 0.022 | 5.4 | 2,500 | 40.9 | 6.4 | 1.1 | 2.4 | 2.6 | 3.6 | 16.0 | 45.5 |
| 92 | තුර්කිය | 2003 | 0.028 | 6.6 | 4,378 | 42.0 | 7.3 | 1.3 | 2.0 | 3.2 | .. | 2.7 | 18.1 |
| **මධ්‍යම මානව සංවර්ධනය** | | | | | | | | | | | | | |
| 95 | ජෝර්දානය | 2009 | 0.008 | 2.4 | 145 | 34.4 | 1.3 | 0.1 | 0.2 | 0.0 | 0.0 | 0.4 | 13.3 |
| 97 | ශ්‍රී ලංකාව | 2003 | 0.021 | 5.3 | 1,027 | 38.7 | 14.4 | 0.6 | 3.0 | 2.6 | 5.3 | 7.0 | 15.2 |
| 101 | චීනය | 2003 | 0.056 | 12.5 | 161,675 | 44.9 | 6.3 | 4.5 | 3.0 | 7.7 | 9.1 | 15.9 | 2.8 |
| 103 | තායිලන්තය | 2005 | 0.006 | 1.6 | 1,067 | 38.5 | 9.9 | 0.2 | 0.5 | 0.5 | 1.2 | 10.8 | 8.1 |
| 109 | මාල දිවයින | 2009 | 0.018 | 5.2 | 16 | 35.6 | 4.8 | 0.3 | 0.2 | 0.4 | 0.9 | 1.5 | .. |
| 112 | පිලිපීනය | 2008 | 0.064 | 13.4 | 12,083 | 47.4 | 9.1 | 5.7 | 2.9 | 6.1 | 11.0 | 22.6 | 26.5 |
| 123 | දකුණු අප්‍රිකාව | 2008 | 0.057 | 13.4 | 6,609 | 42.3 | 22.2 | 2.4 | 4.6 | 9.6 | 8.0 | 17.4 | 23.0 |
| 124 | ඉන්දුනීසියාව | 2007 | 0.095 | 20.8 | 48,352 | 45.9 | 12.2 | 7.6 | 10.2 | 13.2 | 15.5 | 18.7 | 13.3 |
| 128 | වියට්නාමය | 2002 | 0.084 | 17.7 | 14,249 | 47.2 | 18.5 | 6.0 | 15.3 | 10.0 | .. | 13.1 | 14.5 |
| 134 | ඉන්දියාව | 2005 | 0.283 | 53.7 | 612,203 | 52.7 | 16.4 | 28.6 | 11.9 | 48.2 | 51.1 | 41.6 | 27.5 |
| 139 | කාම්බෝජය | 2005 | 0.251 | 52.0 | 6,946 | 48.4 | 21.3 | 22.0 | 28.6 | 48.3 | 51.6 | 28.3 | 30.1 |
| 141 | භූතානය | 2010 | 0.119 | 27.2 | 197 | 43.9 | 17.2 | 8.5 | 2.6 | 16.9 | 22.1 | 26.2 | 23.2 |
| **පහළ මානව සංවර්ධනය** | | | | | | | | | | | | | |
| 143 | කෙන්යාව | 2009 | 0.229 | 47.8 | 18,863 | 48.0 | 27.4 | 19.8 | 30.8 | 42.6 | 47.6 | 19.7 | 45.9 |
| 145 | පාකිස්තානය | 2007 | 0.264 | 49.4 | 81,236 | 53.4 | 11.0 | 27.4 | 6.9 | 32.1 | 40.5 | 22.6 | 22.3 |
| 146 | බංග්ලාදේශය | 2007 | 0.292 | 57.8 | 83,207 | 50.4 | 21.2 | 26.2 | 2.5 | 48.2 | 56.7 | 49.6 | 40.0 |
| 156 | නයිජීරියාව | 2008 | 0.310 | 54.1 | 81,510 | 57.3 | 17.8 | 33.9 | 35.7 | 39.6 | 52.8 | 64.4 | 54.7 |
| 157 | නේපාලය | 2006 | 0.350 | 64.7 | 18,008 | 54.0 | 15.6 | 37.1 | 14.4 | 56.3 | 63.4 | 55.1 | 30.9 |
| 173 | සිම්බාබ්වේ | 2006 | 0.180 | 39.7 | 4,974 | 45.3 | 24.0 | 14.8 | 24.2 | 31.6 | 39.0 | .. | 72.0 |
| 174 | ඉතියෝපියාව | 2005 | 0.562 | 88.6 | 65,798 | 63.5 | 6.1 | 72.3 | 53.8 | 83.7 | 88.3 | 39.0 | 38.9 |
| 187 | ප්‍රජාතන්ත්‍රවාදී කොන්ගෝව | 2007 | 0.393 | 73.2 | 44,485 | 53.7 | 16.1 | 46.5 | 55.5 | 62.0 | 72.8 | 59.2 | 71.3 |

**මූලාශ්‍රය: මානව සංවර්ධන වාර්තාව 2011**

1. මානව සංවර්ධන දර්ශකයේ ශ්‍රේණිගත කිරීම
2. රට
3. වසර
4. MPI අගය
5. බහුමාන දරිද්‍රතාවෙන් යුතු ජනගහනය, ජනගහන දරිද්‍රතා %
6. බහුමාන දරිද්‍රතාවෙන් යුතු ජනගහනය, ජනගහන දරිද්‍රතා දහස්
7. බහුමාන දරිද්‍රතාවෙන් යුතු ජනගහනය, දරිද්‍රතා තීව්‍රතා %
8. සියයට 22 - 33 අතර විහිනතාවයෙන් පෙළෙන ප්‍රතිශතය %
9. අන්ත දරිද්‍රතාව %
10. විහිනතාවන්ගේ සාපේක්ෂ කොටස, පිරිසිදු ජලය %
11. විහිනතාවන්ගේ සාපේක්ෂ කොටස, දියුණු සනීපාරක්ෂක පහසුකම් %
12. විහිනතාවන්ගේ සාපේක්ෂ කොටස, නවීන ඉන්ධන භාවිතය %
13. ආදායම් දරිද්‍රතාව, දිනකට/1.25 %
14. ජාතික දරිද්‍රතා රේඛාව %

කට වඩා අඩුවෙන් උපයන ප්‍රමාණයට) වඩා වැඩි ප්‍රමාණයකි. 2011 මානව සංවර්ධන වාර්තාව මගින් ප්‍රකාශයට පත් කරන ලද නවතම MPI අගයට අනුව වඩාත් ම දුප්පත් ජනගහනය ජීවත් වන්නේ මැදි ආදායම් ලබන රටවල ය. මිලියන 1,189 ක් පමණ වන එම පුද්ගලයින් සංඛ්‍යාව පහළ ආදායම් ලබන රටවල දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනය (පුද්ගලයින් මිලියන 459) මෙන් දෙගුණයක් පමණ වේ. අප්‍රිකානු මහාද්වීපයේ රටවල් 38 ක් ඉහළ ම MPI අගයක හෙවත් පහළ දරිද්‍රතාවක පැවතුණු අතර දකුණු ආසියාවේ පහළ ම දරිද්‍රතාවයේ සිටින පිරිස අප්‍රිකානු උප මහාද්වීපයේ දුප්පත් ජන කොටසට වඩා ඉහළ අගයක පැවතුනි. අඩු ආදායම් ලබන රටවල දරිද්‍රතාවෙන් පෙළෙන පිරිස් ඒ ඒ රටට අදාළ ව සියයට 5 ක සිට සියයට 92 දක්වා පරාසයක පැවතුනි. උදාහරණ ලෙස කිර්ගිස්තාන්හි දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රතිශතය සියයට 5 ක් වන අතර නයිගර් රාජ්‍යයෙහි එම ප්‍රමාණය සියයට 92 ක් පමණ වේ. මැදි ආදායම් ලබන රටවල සියයට 0 සිට සියයට 77 පමණ මට්ටමක එම පරාසය පැවතුනි. ඉහලම MPI අගයෙන් යුතු ජනගහනයෙන් සියයට 50 ක් ම දකුණු ආසියාතික රටවල ජීවත් වේ. එම ප්‍රමාණය පුද්ගලයින් මිලියන 487 ක් පමණ වේ. අන්ත දිළිඳු තත්ත්වයේ ජීවත් වන පිරිස් අප්‍රිකාවේ පමණක් නො ව දකුණු ආසියානු රටවල ද ජීවත් වේ. මෙම අධ්‍යයනයෙන් හෙළි වූ තවත් කරුණක් වූයේ රටවල් 25 ක පමණ MPI ලබාගත් ප්‍රතිශතය දිනකට එක්සත් ජනපද ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය මෙන් 1.5 ගුණයක් පමණ වන බවයි.

1 වන සංඛ්‍යා සටහනින් දැක්වෙන්නේ අප මෙ තෙක් සාකච්ඡා කළ දර්ශක අගයන් ඇතුළත් තෝරාගත් රටවල් රැසකට අදාළ තොරතුරු වේ. මෙහි දී මානව සංවර්ධන දර්ශකය අනුව රටවල් වර්ග කර එම රටවල් ලබාගත් දර්ශක අගයන් දක්වා ඇත.

මානව සංවර්ධන දර්ශකය අනුව 97 වැනි ස්ථානයේ පසු වන ශ්‍රී ලංකාවේ ක්‍රය ශක්තියට ගලපන ලද ආදායම අනුව දිනකට ඩොලර් 1.25 කට අඩුවෙන් ලබන ජන සංඛ්‍යාව සියයට 7.0 ක් පමණ වේ. මෙය රුවන්ඩාව වැනි රටක සියයට 76.8 තරම් ඉහළ ප්‍රතිශතයකි. ජාතික දරිද්‍රතා ඉමට යටින් සිටින ජනගහනය ශ්‍රී ලංකාවේ සියයට 15.2 කි. චීනයේ එය සියයට 2.3 ක් පමණ වන අඩු ප්‍රතිශතයක වන අතර හයිටි රාජ්‍යයේ එම ප්‍රමාණය සියයට 77 කි. MPI අගය අනුව බලනවිට සලකා බැලෙන රටවල් 109 ක් අතරින් ශ්‍රී ලංකාව 35 වැනි ස්ථානයේ පසුවෙමින් MPI අගය 0.021 ක් ලබාගෙන ඇත. 2011 මානව සංවර්ධන වාර්තාවේ දත්ත අනුව දරිද්‍රතාවෙන් පෙළෙන ජන ප්‍රතිශතය සියයට 5.3 ක් සහ ජන සංඛ්‍යාව මිලියන 1.027 කි. දරිද්‍රතාවෙන් පෙළෙන ජන ප්‍රතිශතය අනුව රටවල් 109 පෙළ ගැස් වූ විට ශ්‍රී ලංකාව 48 වන ස්ථානයේ පසුවෙයි. දරිද්‍රතා තීව්‍රතා මිනුම අනුව රටවල් 109 පෙළ ගැස් වූ විට ශ්‍රී ලංකාවේ ස්ථානය 27 වන අතර දරිද්‍රතා තීව්‍රතා මිනුමෙහි අගය සියයට 38.7 කි. දරිද්‍රතා තීව්‍රතා මිනුම චෙක් ජනපදය වැනි තෙ වන ස්ථානය ලබාගත් රටක සියයට 33.5 ක් වන අතර නයිජීරියාවේ (ස්ථානය 186) සියයට 69.4 ක් පමණ වේ. සමස්ත විහිනතාවන්ගෙන් සියයට 22 - 33 අතර විහිනතා මට්ටමකින් යුතු ප්‍රතිශතය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සියයට 14.4 කි. එය කෙන්යාව වැනි රටක සියයට 27.4 ක් පමණ වේ. අනිත් අතට ක්‍රෝඒසියාව වැනි රටක සියයට 0.1 ක පමණ වන අගයකි. අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන ජන ප්‍රතිශතය ශ්‍රී ලංකාවේ (ස්ථානය 35) සියයට 0.6 කි. එම ප්‍රතිශතය නයිජීරියාවේ සියයට 81.8 ක් වේ. මීට අමතර ව පිරිසිදු ජලය ලබාගැනීමට අපහසු ප්‍රතිශතය සියයට 3.0 පමණ වන අතර දියුණු සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීමේ තත්ත්වය සියයට 2.6 කි. නවීන ඉන්ධන භාවිතය නො මැති පිරිස ජනගහනයෙන් සියයට 5.3 කි. මෙම විහිනතාවන්ට ලක් වූ රටවල් පිළිවෙළින් පෙළ ගැස්වීමේ දී රටවල් 109 ක් අතරින් ශ්‍රී ලංකාව ලබාගත් ස්ථානය පිළිවෙළින් 44, 39 සහ 41 වේ.

**සාරාංශය**

දරිද්‍රතාව හඳුනා ගැනීමේ දී ඊට ආවේනික අංග ලක්ෂණ විමසා බැලීම තුළ වඩාත් නිවැරදි ව දරිද්‍රතාව මැන ගැනීමත් දරිද්‍රතාව නැති කර ගැනීමෙහි ලා අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීමත් සිදුවේ. මේ අනුව මෙම ලිපියේ විස්තර කෙරුණු බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් වඩාත් යෝග්‍ය මිනුමක් සපයා ඇති අතර මෙම මිනුම ද දැනට සිදුකෙරෙමින් යන අයුරින් ම අදාළ යාවත්කාලීන කිරීම් සහ පුනරීක්ෂණය කිරීම් සිදු කළ යුතුවේ. සාපේක්ෂ ව පොදුවේ සලකා බැලෙන විට ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම් අනිකුත් රටවල් විශාල සංඛ්‍යාවකට පහළ මට්ටමක එ නම් වඩා යහපත් ජීවන තත්වයක පවතින නමුත් දරිද්‍රතාව මුලිනුපුටා දැමීමෙන් පමණක් සතුටු දායක මට්ටමකට එළඹිය හැක. එ බැවින් දරිද්‍රතාව පිළිබඳ ව කටයුතු කිරීමේ වඩාත් පුළුල් මට්ටමේ එළඹුමක් මෙ මගින් සපයා දෙයි.✪

**මූලාශ්‍ර:**


1. Human Development Reports
2. http//www.ophi.org.uk/policy/multidimensional-poverty-index

# සාර්ව ආර්ථික සන්දර්භය තුළ

# විදේශ සංචිත පිළිබඳ හැඳින්වීමක්

**නිලූකා පරණගම**

සහකාර අධ්‍යක්ෂිකා, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

රටක විදේශ විනිමය අනුපාතිකයේ අගය රැකගැනීමට, විදේශීය ගෙවීම් ඌනතා පියවීමට සහ වෙනත් කාර්යය සඳහා අවශ්‍ය විදේශ විනිමය සැපයීමට යොදාගනු ලබන්නා වූ මාධ්‍යයක් ලෙස විදේශ බැංකුවල තැන්පතු වශයෙන්, විදේශ රාජ්‍ය බැඳුම්කර වශයෙන්, විදේශ රාජ්‍යයක් විසින් සහතික කළ සුරැකුම්පත් වශයෙන්, මූල්‍ය රන් (Monetary Gold) වශයෙන් සහ විදේශ ගැනුම් හිමිකම් (SDR - Special Drawing Rights) වශයෙන් පවත්වාගෙන යන වත්කම් එම රටෙහි විදේශ සංචිත වශයෙන් හඳුන්වනු ලැබේ.

**මෙම විදේශ සංචිත හිමි පාර්ශ්ව තුනක් වෙයි.**

1. රජය
2. මහ බැංකුව
3. වාණිජ බැංකු

මෙ කී හිමිකාරිත්වය පදනම් කරගෙන විදේශ සංචිත පහත පරිදි වර්ග කොට දක්වනු ලැබේ.

1. නිල විදේශ සංචිත (Gross Official Reserves)
   රජය සහ මහ බැංකුව සතු විදේශ සංචිතවල එකතුව

2. මුළු විදේශ සංචිත (Gross Total Reserves)
   නිල විදේශ සංචිත + වාණිජ බැංකු සතු විදේශ සංචිත

**අර්ථ දැක්වීම**

විදේශ සංචිත සම්බන්ධයෙන් පැහැදිලි නිර්වචනයක් නැත. එ නමුත්, ප්‍රතිපත්ති සහ මෙහෙයුම් අරමුණු වෙනුවෙන් ලොව බොහෝ රටවල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි Balance of Payments Manual and Guidelines on Foreign Exchange Reserve Management - 2001 ප්‍රකාශනයෙන් යෝජිත නිර්වචනය යොදා ගනියි. එම නිර්වචනයට අනුව විදේශ සංචිත වශයෙන් හඳුන්වනු ලබන්නේ ගෙවුම් තුලනයේ ඇතිවන අසමතුලිතතා මූල්‍යකරණයට සෘජුවමත්, විදේශ විනිමය වෙළෙඳපොළ මැදිහත්වීම මඟින් විනිමය අනුපාතයට බලපෑම් කිරීම පිණිස එවැනි අසමතුලිතතාවල විශාලත්වය පාලනය කිරීමට වක්‍රවත් සහ වෙනත් අරමුණු වෙනුවෙනුත් මූල්‍ය අධිකාරීන්ට පහසුවෙන් ලබාගත හැකි සහ ඒවා මඟින් පාලනය කරනු ලබන විදේශ වත්කම් ය.

විදේශ සංචිත මැනීමේ සම්මත ක්‍රමය වනුයේ මූල්‍යමය අධිකාරියකට අයත් වගකීමෙන් නො බැඳුණු අන්තර්ජාතික වත්කම් සැළකිල්ලට ගැනීම ය. කෙ සේ වුව ද, බැංකු සහ ආයතන සන්තක විදේශ මුදල් සහ සුරැකුම් නිල විදේශ සංචිත ගණනයෙහි ලා සළකා බලන්නේ නැත.

**විදේශ සංචිත පවත්වාගැනීමේ අවශ්‍යතාව**

විදේශ සංචිත පවත්වා ගැනීම කෙරෙහි බලපාන අභිප්‍රායයන් තුනක් වෙයි. ඒවා නම්,

1. ගනුදෙනුකිරීමේ චේතනාව
2. සමපේක්ෂණ චේතනාව
3. ආරක්ෂණ චේතනාව

ගනුදෙනුකිරීමේ චේතනාවෙන් මෙහෙයවනු ලබන පුද්ගලික බැංකු විසින් හසුරුවන්නා වූ අන්තර්ජාතික වෙළෙඳාම ව්‍යවහාර මුදල් ගලනය ඉහළ නංවයි. එ ලෙස ම, පුද්ගලයෝ සහ ආයතන සමපේක්ෂණ චේතනාවෙන් කටයුතු කරති. කෙ සේ වුව ද, ආරක්ෂණ චේතනාව මත පදනම් ව විදේශ වත්කම් පවත්වා ගෙන යන්නා වූ මහ බැංකු, මූලික වශයෙන් ම අනපේක්ෂිත විදේශ මුදල් ප්‍රවාහ සඳහා වන අවසාන පිළිසරණවන්නා ලෙසින් ක්‍රියා කරයි.

මුදල් සඳහා වන ඉල්ලුමට සම කළ හැකි විදේශ ව්‍යවහාර මුදල් තබාගැනීමේ ආරක්ෂණ චේතනාව අනපේක්ෂිත හිඟයක් ආවරණය කිරීමේ පිරිවැය සහ ධනය සම්බන්ධයෙන් අනුලෝම

සම්බන්ධකමක් පෙන්වයි. එ සේ ම, එය විකල්ප වත්කම් තබාගැනීමෙන් කළ හැකි ඉපැයුම් සම්බන්ධයෙන් ප්‍රතිලෝම සම්බන්ධකමක් පෙන්වයි. "හදිසි ආවරණයක්" වශයෙන් නිල සංචිත පවත්වාගැනීමේ ආරක්ෂණ චේතනාව උප ප්‍රධාන කොටගෙන, ගනුදෙනු සංචිත ඉහළ නැංවිය හැකි නම් එයින් රටකට වැඩි ප්‍රතිලාභයක් උපයාගත හැකි ය. අන්තර්ජාතික මුදල් සහ ප්‍රාග්ධන ප්‍රවාහ ක්‍රමවත් ව උකහාගැනීමට අවස්ථාව සළසා ලමින් විදේශ විනිමය අනුපාතය කළමනාකරණයට හෝ පවත්වාගෙන යෑමට විදේශ සංචිත උපකාරී වෙයි.

සැකෙවින් ගත් කල, විදේශ ව්‍යවහාර මුදල් සැපයුම සහ ඒ සඳහා වන ඉල්ලුම අතර තුලනයක් පවත්වා ගෙන යෑමේ සහ විදේශ ගනුදෙනු අඛණ්ඩ ව සිදු කිරීම සඳහා රටකට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය ආරක්ෂා කිරීමේ ජාතික ප්‍රතිලාභය ඉහළ නැංවීමේ අදහසින් ආරක්ෂණ සහ ගනුදෙනු කිරීමේ චේතනාවෙන් නිල සංචිත පවත්වාගෙන යනු ලැබේ.

හිමිකරු වශයෙන් ස්වෛරී රජයක් සතු වත්කම් ආශ්‍රයෙන් හෝ භාරකරු වශයෙන් මූල්‍ය අධිකාරියක් සතු වත්කම් ආශ්‍රයෙන් සංචිත වත්කම් අර්ථ දැක්විය හැකි ය. සංචිත පවත්වාගෙන යෑමේ අරමුණ මුදල් අධිකාරියක් සම්බන්ධයෙන් ගත් කල මුදල් ප්‍රතිපත්ති ඉලක්කයන්ගෙන් බැහැර විය නො හැකි වුව ද රජයක් සම්බන්ධයෙන් ගත් කල මුදල් අධිකාරියේ ඉලක්ක ඉක්මවා යන්නක් විය හැකි ය. එ හෙයින් අවසාන වශයෙන් ගත් කල සංචිත වත්කම් පවත්වා ගෙන යෑමේ සැබෑ අරමුණ භාරකරු වශයෙන් මූල්‍ය අධිකාරියත් හිමිකරු වශයෙන් රජයත් ඉලක්ක කරගන්නා වූ අරමුණුවල සාමාධානයෙන් පැන නගින්නක් විය හැකි ය. රජයක් විසින් භාණ්ඩ සහ සේවා මිල දී ගැනීම පහසු කරවන්නා වූ යාන්ත්‍රණයක් ලෙස, රජයේ විදේශ ණය සේවාකාරකයක් ලෙස, හදිසි අවස්ථාවල දී යොදාගත හැකි ආරක්ෂණයක් ලෙස සංචිත යොදා ගන්නා අවස්ථා බහුල වුව ද කලාතුරකින් ආදායම් මූලාශ්‍රයක් වශයෙන් එය යොදාගන්නා අවස්ථා ද වෙයි.

### සංචිතවල ප්‍රමාණාත්මකභාවය

සංචිත පවත්වාගෙන යෑමේ මූලික අභිප්‍රාය මත යෝග්‍ය විදේශ සංචිත ප්‍රමාණය නිර්ණය කිරීම පිළිබඳ විවිධ වූ ආකෘති ගොඩනැගී ඇත. යෝග්‍ය විදේශ සංචිත ප්‍රමාණය කුමක් දැ යි තීරණය කිරීමේ ප්‍රශස්ත ආකෘතියක් හඳුන්වා දීමට බොහෝ ආර්ථික විද්‍යාඥයින් උත්සුක වී තිබේ. ආන්තික සමාජ පිරිවැය ආන්තික සමාජ ප්‍රතිලාභයට සමාන වන ප්‍රමාණය ප්‍රශස්ත සංචිත මට්ටම බවට එක් මතයකි. සංචිතවල ආන්තික ඵලදායිතාව සහ සංචිත වත්කම් මත ඉපැයූ පොලිය යන දෙකෙහි එකතුව මූර්ත වත්කම්වල ආන්තික ඵලදායිතාවට සමාන වන මට්ටමේ දී සංචිතවල ප්‍රශස්ත ප්‍රමාණය තීරණය කළ හැකි බවට ද මතයක් වෙයි. මෙම ආකෘතියෙන් කියැවෙන්නේ සංචිත කළමනාකරණයේ අති ප්‍රමුඛ අරමුණ විනිමය අනුපාතික ස්ථාවරත්වය වන බව ය. සංචිත පවත්වාගෙන යෑමේ පිරිවැය සහ ප්‍රතිලාභ විවිධ ආකාරයෙන් මැන දැක්විය හැකි නිසා මෙම ප්‍රවේශයන් මාර්ගයෙන් ප්‍රශස්ත සංචිත මට්ටම නිර්ණය කිරීම උදෙසා දර්ශක අතිවිශාල ප්‍රමාණයක් ගොඩ නගාගත හැකි වෙයි.

සංචිතවල ප්‍රමාණාත්මක බව නිර්ණයකිරීම සඳහා යොදාගත හැකි දර්ශක කාණ්ඩ හතරක් වෙයි. ඒවා නම්,

1. මුදල්මය දර්ශක
2. වෙළෙඳමය දර්ශක
3. ණය පදනම් දර්ශක
4. ජංගම - ප්‍රාග්ධන ගිණුම් දර්ශක

### මුදල්මය දර්ශක

ප්‍රාග්ධන ප්‍රවාහ අධි ගලනයක් සඳහා වන විභවතාව මැන දැක්වීම සංචිත - පුළුල් මුදල් සහ සංචිත - පදනම් මුදල් වැනි මුදල්මය දර්ශකවලින් සිදු කෙරෙයි. මුදල් සඳහා වන අස්ථායි ඉල්ලුමක් හෝ දුර්වල බැංකු පද්ධතියක් එ බඳු ප්‍රාග්ධන ගලනයකට වැඩි ඉඩක් සළසා ලිය හැකි ය. කෙ සේ වුව ද, මුදල්මය දර්ශකවල අඩුපාඩු කිහිපයක් ම වෙයි. මුදල් සඳහා වන ඉල්ලුම ස්ථාවර, එ මෙන් ම, දේශීය ව්‍යවහාර මුදල කෙරෙහි වන විශ්වාසය ඉතා ඉහළ රටවල දේශීය මුදල් ඉල්ලුම විශාල විය හැකි අතර මුදල් - සංචිත අනුපාත සාපේක්ෂ ව කුඩා විය හැකි ය. එ හෙයින්, සංචිත හා සසඳන කල විශාල මුදල් තොගයක් තිබිය දී මුදල් වශයෙන් ගලායන විශාල ප්‍රාග්ධන ප්‍රවාහයක් පෙන්නුම් කළ ද එය සැබෑ ප්‍රාග්ධන ප්‍රවාහයක් පිළිබඳ ව පුරෝකථනය කළ හැකි දර්ශකයක් ම විය නො හැකි ය. තව ද, දේශීය ප්‍රාග්ධන ප්‍රවාහ සඳහා වන විභවතාව මුදල්මය දර්ශකවලින් පුළුල් ව ග්‍රහණය කර ගන්නේ ද නැත. එයට අමතර ව, අන්තර්ජාතික අර්බුදවල හටගැන්ම සහ ගැඹුරත් සමඟ මුදල්මය දර්ශක දක්වන සබඳතාව ඉතාමත් දුර්වල බව ද ප්‍රායෝගික තත්ත්ව අධ්‍යයනයන්ගෙන් සනාථ වී තිබේ.

### වෙළෙඳමය දර්ශක

ආර්ථිකයක ප්‍රමාණය සහ විවෘතභාවය විසින් සරල ව මැන දක්වන, ආනයන මාස කීයක් සඳහා සංචිත ප්‍රමාණවත් දැ යි දැක්වීම වෙළෙඳමය (ආනයනික) දර්ශකයකි. එයින් ඍජු ව ම ගෙනහැර දැක්වෙන්නේ රටක සියලු ම ආකාරයේ (එ නම්, රට තුළට සහ රටින් පිටතට වන) ප්‍රවාහ සිඳී යන්නේ නම් එම රට විසින් වර්තමානයේ දී සිදු කරනු ලබන ආනයන ඒ ආකාරයෙන් ම නො කඩවා සිදු කළ හැකි ඉදිරි මාස ගණන යි. ජංගම ගිණුම කෙරෙහි අවධානය යොමු කෙරෙන බැවින්, ප්‍රාග්ධන වෙළෙඳපොළට සීමිත ප්‍රවේශයක් ඇති, එ මෙන් ම, ඒ හේතුවෙන් කම්පනවලට ලක් නො වන කුඩා ආර්ථිකවලට මෙම මිනුම අදාළ වෙයි. කෙ සේ වුව ද, විශාල ප්‍රාග්ධන ගිණුමක් ඇති විවෘත ආර්ථිකයක් ඇති රටකට මෙම මිනුම යෝග්‍ය එකක් විය නො හැකි ය.

### ණය පදනම් දර්ශක

මෙම දර්ශක හඳුන්වා දී ඇත්තේ මෑතක දී ය. අන්තර්ජාතික අර්බුද පැන නගිත් ම, මූල්‍යමය අර්බුද හඳුනාගැනීම සඳහා වඩාත් සුදුසු දර්ශකයක් වශයෙන් ශේෂිත පරිණතියට අනුව කෙටි කාලීන ණය සංචිතවලට දරන අනුපාතය අධ්‍යයන කිහිපයකින් හඳුනාගැනීමත් සමඟ ම මේ දර්ශක ද කරළියට ආවේ ය. අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි හානිකර වර්ධනයන් හා බැඳුණු අවදානම මැනීම සඳහා මෙම ණය පදනම් දර්ශක ප්‍රයෝජනවත් ය. එළැඹෙන වසර මුළුල්ලේ අනේවාසිකයන්ට ගෙවීමට ඇති සියලු ණය පිළිබඳ මිනුමක් ශේෂිත පරිණතියට අනුව කෙටි කාලීන ණය මඟින් ලැබෙන නිසා ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි විකෘති හැසිරීම් අභිමුවෙහි හැඩගැසීමට රටකට කොපමණ කලක් ගත වේ ද යන්න පිළිබඳ ප්‍රයෝජනවත් මිනුමකින් එය සමන්විත වෙයි. අවිනිශ්චිත නමුත් ප්‍රාග්ධන වෙළෙඳපොළට සැළකිය යුතු ප්‍රවේශයක් ඇති රටවල ප්‍රාග්ධන ප්‍රමාණත්වය දැක්වීමේ වඩාත් ම වැදගත් තනි දර්ශකය වශයෙන් අධ්‍යයනවලින් එය හඳුනාගෙන ඇත.

### ජංගම - ප්‍රාග්ධන ගිණුම් දර්ශකය

විදේශ සංචිත ප්‍රමාණවත් බව මැනීමේ නවීනතම ප්‍රවේශය වනුයේ ද්‍රවශීලතා අවදානම පිළිබඳ අර්ථවත් මිනුමක් වන ජංගම - ප්‍රාග්ධන ගිණුම් එක් ව ගැනීම ය. සුප්‍රසිද්ධ ගුයිදොත්ති (Guidotti) නියමයෙන් කියවෙන්නේ රටක සංචිත ප්‍රමාණය එහි කෙටි කාලීන විදේශ ණයට සමාන විය යුතු බව ය. ආර්ජන්ටිනාවේ හිටපු මුදල් නියෝජ්‍ය ඇමැතිවරයා වන පැබ්ලෝ ගුයිදොත්ති විසින් 1999 වර්ෂයේ පැවැත්වුනු 33 කණ්ඩායමේ සමුළුවක දී ඉදිරිපත් කළ මෙම අදහස ඇලන් ග්‍රීන්ස්පෑන් ඇතුළු මහ බැංකුකරුවන් රැසක ගේ දැඩි ඇගැයීමට ලක් ව ඇත. කෙටි කාලීන ණය අනුපාතය සමඟ ජංගම ගිණුමේ ප්‍රක්ෂේපිත හිඟය එක් ව ගත් විට එය විදේශ ණයගැනීම්වලට නො පෙළැඹී බාහිර අසමතුලිතතා අභිමුව රටකට කො පමණ කලක් පැවැතිය හැකි ද යන්න පැහැදිළි කෙරෙන දර්ශකයක් ලෙසින් භාවිතා කළ හැකි ය. මේ අනුව ගත් කල, ගුයිදොත්ති නියමයෙන් සරල ව ප්‍රකාශ කෙරෙන්නේ විදේශ ණය ගැනීම්වලින් තොර ව රටකට වසරක කාලයක් පැවැතීමට ප්‍රමාණවත් සංචිත එය විසින් පවත්වාගත යුතු බව යි.

මේ සෑම එකකින් ම ප්‍රමාණාත්මක බව පිළිබඳ අදහසක් පළ කළ ද ඒ එකක් හෝ එය මුළුමනින් ම විස්තර කිරීමට අපොහොසත් ය.

### සංචිත පවත්වා ගෙන යෑමේ පිරිවැය හා ප්‍රතිලාභ

සංචිතවල ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් වන ප්‍රධාන ම ගැටලුවක් වනුයේ සංචිත පවත්වාගෙන යෑමේ සමස්ත ආර්ථික පිරිවැය සහ එහි ප්‍රතිලාභ පිළිබඳ ව තීරණය කිරීම ය. විශ්ලේෂණාත්මක කාර්යයන් වෙනුවෙන් සංචිත පවත්වාගෙන යෑමේ ආන්තික සමාජ පිරිවැය සහ ආවස්ථික පිරිවැය පිළිබඳ සංකල්ප යොදාගත හැකි නමුත් ඒවා ගණනය පහසු නො වේ.

සංචිත පවත්වාගෙන යෑමේ සෘජු මූල්‍යමය පිරිවැය විදේශ ණය සඳහා ගෙවූ පොලිය සහ සංචිත වශයෙන් ඇති විදේශ වත්කම්වලින් උපයන ප්‍රතිලාභ අතර වෙනස වශයෙන් ගතහොත් ද්‍රවශීලතාව අවශ්‍ය පරිදි පවතින බව තහවුරු කිරීමේ රක්ෂණ වාරිකයක් ලෙසින් එම පිරිවැය සැළකිය හැකි ය. එ වැනි පිරිවැයක් දැරීමේ ප්‍රතිලාභය වන්නේ අවදානම පිටුදැකීම පමණක් නො වේ. එය යහපත් ණය ශ්‍රේණියක් ලබාගැනීමට ද ණය ගිවිසගැනීම සඳහා පුද්ගලික අංශයේ සහභාගීවන්නන් යොමු කරවන යහපත් මූල්‍යමය පරිසරයක් ඇති කරවීමට ද උපකාරී වෙයි. සංචිත සඳහා වන සතුටුදායක මට්ටමක් මූල්‍යමය සහ ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරදීමට සමත් වුව ද එය ප්‍රමාණාත්මක ව මැන දැක්වීම අපහසු ය.

### සංචිත කළමනාකරණය

මෑතක සිට අන්තර්ජාතික සංචිත කළමනාකරණය පිළිබඳව අවධානය ඉහළ යෑම කෙරෙහි බල පෑ කරුණු ගණනාවක් වෙයි.

1. එක්සත් ජනපදය ඩොලරයට විකල්පයක් ලෙසින් යූරෝ මුදල කරළියට ඒම
2. බොහෝ මහ බැංකු රන් සංචිත පවත්වා ගැනීමෙන් බැහැරවීම
3. විනිමය අනුපාතික රජයනයන් ගේ වෙනස්වීම්
4. සංචිතවල ප්‍රමාණාත්මකභාවය සහ අර්බුද වැළැක්වීම උදෙසා එහි කාර්යයභාරය සම්බන්ධයෙන් වන විවිධ අදහස්
5. අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් මූල්‍යයන පරතරයන් ගණනය කිරීමේ දී යොදාගන්නා "සංචිත ඉලක්ක" පවත්වාගෙන යෑමේ වැදගත්කම

තව ද, වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ව පවත්නා දිනෙන් දින ඉහළ යන අවධාරණය ද මෑත කාලයේ දී, මෙම විෂයය සම්බන්ධයෙන් අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් නිකුත් කර ඇති උපදෙස් නිසා ද සංචිත කළමනාකරණය කෙරෙහි අවධානය ඉහළ ගොස් තිබේ.

සංචිත කළමනාකරණය යනු රටක් විසින් අපේක්ෂිත අරමුණු සපුරාගනු වස් අධිකාරීන් විසින් පාලනය කරනු ලබන සහ නිල විදේශ වත්කම්වල ප්‍රමාණවත් බව සහතික කරන ක්‍රියාවලියකි. සංචිත සහ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණයට සංචිත කළමනාකරණ ආයතන පිහිටුවනු ලැබේ. අවිවාදයෙන් ම, රටක නිල සංචිත කළමනාකරණ ආයතනය වශයෙන් ක්‍රියාකරන්නේ එහි මහ බැංකුව ය. එහෙයින් සංචිත කළමනාකරණයේ අරමුණු මූල්‍ය අධිකාරියේ අරමුණු තුළට

ම ගැබ් ව තිබේ. මූල්‍ය අධිකාරියක් වශයෙන් මහ බැංකුවක මූලික අරමුණ වනුයේ රටෙහි සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීමත් විදේශ අංශයේ ස්ථාවරත්වය කෙරෙහි සැළකිලිමත්වීමත් ය. සංචිත භාරකරුවකු වශයෙන් මහ බැංකුවක ප්‍රධාන අරමුණු වනුයේ සංචිතවල ද්‍රවශීලතාව, ආරක්ෂාව සහ ආයෝජන ඵලදායි බව සහතික කිරීම ය. මෙම අරමුණු හා නො ගැටෙන ආකාරයෙන් ද ඒවා ශක්තිමත් කෙරෙන ආකාරයෙන් ද විශේෂිත වූ සංචිත කළමනාකරණ ආයතන පිහිටුවීමට සහ එ වැනි ආයතන සඳහා අනුමැතිය දීමට මහ බැංකුවක් ක්‍රියාකරයි.

සංචිත කළමනාකරණයේ දී, සංචිත පවත්වාගෙන යෑමේ ප්‍රතිලාභ සහ පිරිවැය නිරන්තරයෙන් විමසා බැලෙයි. ප්‍රමාණවත් සංචිත පවත්වා ගෙන යෑම සහ ඒවා යහපත් ව කළමනාකරණයේ වැදගත්කම මෑත කාලයේ ඇති වූ අන්තර්ජාතික මූල්‍ය අර්බුදවල දී ද පැහැදිළි විය. උක්ත කරුණු පිළිබඳ ව වෙළෙඳපොළ දැනුම්වත් කොට ඇති විටෙක රටකට බාහිර කම්පනවලින් ආරක්ෂා විය හැකි ය. කෙ සේ වුව ද, දේශීය ප්‍රාග්ධනය ඉහළ නංවාලිය හැකි සම්පත් ඒ සඳහා යොදාගත නො හැකි වීම ඉහළ මට්ටමක සංචිත පවත්වාගෙන යෑමේ ආවස්ථික පිරිවැය වෙයි. එහෙයින්, සංචිත ප්‍රශස්ත මට්ටමක පවත්වා ගෙන යෑම සංචිත කළමනාකරුවන් ගේ වගකීම වෙයි.

## ශ්‍රී ලාංකික අත්දැකීම්

මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකාවට අයත් නිල විදේශ සංචිත කළමනාකරණයේ වගකීම පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවට ය. පනතින් නියම කර ඇති ආකාරයට, ශ්‍රී ලංකා රුපියලේ බාහිර ස්ථායිතාව ආරක්ෂා කරමින්, ජාත්‍යන්තර ගනුදෙනු බාධාවකින් තොර ව ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස ප්‍රමාණවත් සංචිත මට්ටමක් ද්‍රවශීල මුදල්වලින් පවත්වා ගෙන යෑම මහ බැංකුවේ වගකීමක් වෙයි. මෙම කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

ඒ අනුව ආයෝජන තීරණ ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකයන් ගේ හැසිරීම්, සංවර්ධිත රටවල සිදුවන ආර්ථිකමය විපර්යාස, මුදල් වෙළෙඳපොළෙහි හැසිරීම සහ ලෝක සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සිදුවන වෙනස්කම් පිළිබඳ ව තම අවධානය යොමු කරයි. එ හෙයින්, සංචිත පවත්වා ගත යුතු මුදල් වර්ග සහ ඒවා පවත්වා ගත යුතු සංයුතිය පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුව සැළකිලිමත් වෙයි. මෙම කාර්යය සඳහා යොදාගනු ලබන ප්‍රධාන සාධක ලෙසින් සළකා බැලෙන්නේ මහ බැංකුවේ ද්‍රවශීල අවශ්‍යතා, රාජ්‍ය ණය ආපසු ගෙවීම්, ණය අවදානම් මිනුම් සහ ආදායම් උත්පාදන හැකියාවන් ය. එහි දී, ශ්‍රී ලංකාව ලබාගෙන ඇති විදේශ ණය පිළිබඳ ව ද, ආනයනික වටිනාකම් පිළිබඳ ව ද රටේ ආර්ථික වාතාවරණය පිළිබඳ ව ද සැළකිලිමත් වීම මහ බැංකුවේ වගකීමක් වෙයි. එයට අමතර ව, සංචිත ආයෝජනයේ සුරක්ෂිතභාවය සහ ප්‍රතිලාභ පිළිබඳ ව ද මහ බැංකුවේ අවධානය යොමු වෙයි.

මේ සඳහා වන මගපෙන්වීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ලබා දෙනු ලබයි. විදේශ සංචිත කළමනාකරණ කමිටුව විසින් ලබාදෙන නිර්දේශ ඒ සඳහා පදනම් කරගනු ලබයි. බැංකුව ස්ථාපිත කළ දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණය මැනැවින් සිදු ව ඇති බව සැම ගේ පිළිගැනීම වෙයි.


## ශ්‍රී ලංකාවේ විදේශ සංචිත මට්ටම

නිදහස ලැබුණු මුල් කාලයේ දී ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ඉහළ මට්ටමක පැවැතිණි. 1948 දී පැවැති මුළු දළ විදේශ සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 301 ක් විය. එය මාස 13 ක ආනයන සඳහා ප්‍රමාණවත් විය. කොරියානු යුද්ධයේ (1951 - 1953) ප්‍රතිඵලයක් වශයෙන් අපනයන භාණ්ඩ මිල ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ගෙවුම් ශේෂයේ අතිරික්තය ද විදේශ සංචිත ද තරවන්නට විය. නමුත් එම දශකයේ අග භාගය වන විට ගෙවුම් ශේෂ ගැටලු ඇති වන්නට වූ අතර ඒ හේතුවෙන් 1960 දශකයේ මුල් භාගයේ දී යම් යම් විනිමය පාලන නීති පැනවීමට ද සිදු විය. දශකයේ දෙවන භාගය වන විට ගෙවුම් ශේෂ ගැටලු උග්‍ර වන්නට විය. මෙම කාල සීමාව වන විට ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණවත් වූයේ මාස 2 ක ආනයන සඳහා පමණකි. 1966 වන විට මාස 1.9 දක්වා ද 1969 වන විට මාස 1.7 දක්වා ද එය පහළ වැටුණේ ය. 1975 දී ද සංචිත ප්‍රමාණවත් වූයේ මාස 1.7 ක ආනයන සඳහා පමණකි.

1977 දී පාලිත පාවෙන විනිමය අනුපාතික රජයනය හඳුන්වා දුන් නිසා විනිමය පාලනය ලිහිල් කරන ලදී. විවෘත ආර්ථික ක්‍රමය තුළ ආයෝජන අවස්ථා පුළුල් වීම ද 1980 දශකයේ මැද

**1 වන රූප සටහන:**

**ශ්‍රී ලංකාවේ මුළු නිල වත්කම් සහ මුළු විදේශ වත්කම් වල හැසිරීම (2005 - 2011)**





**මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව**

භාගය වන විට ලංකාවේ තේ සඳහා වන ඉල්ලුම ඉහළ යෑම ද හේතු කොට ගෙන රටේ විදේශ සංචිත ප්‍රමාණය ද වර්ධනය විය. කෙ සේ වුව ද, රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවැති ත්‍රස්තවාදී කලබල නිසා සහ දකුණු ප්‍රදේශවල පැවැති දේශපාලනික අස්ථාවරත්වය නිසා එම තත්ත්වය නැවතත් අයහපත් අතට හැරිණි. නමුත් තවදුරටත් ලිහිල් කළ විනිමය පාලන කටයුතු නිසා ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්වීම්, විදේශ ආයෝජන ඉහළ යෑම, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට ලැබුණු දිරිගැන්වීම් සහ අපනයන විවිධාංගීකරණය ආදී කරුණු නිසා 1991 වන විට රටේ විදේශ සංචිත නැවත වතාවක් ඉහළ යන්නට විය.

ත්‍රස්තවාදයට එරෙහි හමුදා මෙහෙයුම් අවසාන අදියරට ළඟා වෙමින් තිබිය දී - එ නම්, 2009 පෙබරවාරි, මාර්තු මාස වනවිට; නැවතත් විදේශ සංචිත අර්බුදයක් ඉස්මතු විය. ඒ වන විට, ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 1 කටත් වඩා අඩු විය. එහෙත්, 2010 වසරේ දී මුළු විදේශ සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 8.621 දක්වා ඉහළ ගිය අතර එය මාස 6.8 ක ආනයන සඳහා ප්‍රමාණවත් විය. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වාතාවරණය පිළිබඳ ව යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගුණු අතර රටේ ණය ශ්‍රේණිය ද ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ

**2 වන රූප සටහන:**

**දළ නිල වත්කම් සහ මුළු වත්කම් මගින් භාණ්ඩ හා සේවා ආනයනය කළ හැකි මාස ගණන (2005 - 2011)**




**මූලාශ්‍රය: වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව**

ආයතන විසින් ඉහළ නංවන ලදී. කෙ සේ වුව ද, යහපත් වූ ආර්ථික වාතාවරණය සමඟ ම ආරම්භ වූ සමාජ - ආර්ථික ප්‍රවර්ධන කටයුතු ද, වාහන සහ රත්රන් ආනයනය ඉහළ යෑම ද ගෝලීය තෙල් මිල ඉහළ යෑම ද වැනි කරුණු ගණනාවක් නිසා රටේ විදේශ සංචිතවල තරමක පහළ යෑමක් 2011 වසරේ දී වාර්තා විය. (2005 - 2010 කාලය තුළ දී රටේ නිල විදේශ වත්කම් ප්‍රමාණය වෙනස් වූ ආකාරය 1 වන රූප සටහනින් ද එම නිල වත්කම් සහ මුළු වත්කම් මගින් භාණ්ඩ හා සේවා ආනයනය කළ හැකි මාස ගණන 2 වන රූප සටහනින් ද නිරූපණය කර ඇත).

**ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කළමනාකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

- සංචිත තබාගන්නා විදේශීය ව්‍යවහාර මුදල් සංයුතිය විවිධාංගීකරණය
- වත්කම් ආයෝජන කළඹ වෙළෙඳපොළ හැසිරීමට අනුව විවිධාංගීකරණය
- අවදානම් කළමනාකරණය
- ආයෝජන තීරණ පිළිබඳ ආතති පරීක්ෂණ සිදුකිරීම
- විදේශ සංචිත පුරෝකථනය සහ ඉලක්කගත රාමුවක් කෙරෙහි අවධානය යොමු කිරීම
- වඩාත් උචිත ප්‍රතිපත්ති ඔස්සේ සංචිත ඉහළ නැංවීමට කටයුතු කිරීම
- විදේශ ආයෝජන දිරිගැන්වෙන ආකාරයෙන් රටේ යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ ආර්ථික ප්‍රතිපත්ති හැඩගැස්වීම
- විදේශ සංචිත කළමනාකරණයට සහ සුදුසු ආයෝජන තීරණ ගැනීමට බාහිර අරමුදල් කළමනාකරුවන් ගේ අදහස්, දැනුම සහ පළ පුරුද්ද ලබාගැනීම

මෙම ක්‍රියාමාර්ග ඔස්සේ ශ්‍රී ලංකාවේ විදේශ සංචිත වර්ධනය කරගැනීමත් ඒවායින් ඵලදායී සේවයක් ලබාගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

ආශ්‍රිත ග්‍රන්ථ:

1. වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව
2. Reddy, Y. V.; India's foreign exchange reserves - policy, status and issues

## දකුණු අප්‍රිකාවට දැමූ

# රන් පොල්ල

**වරුණ චන්ද්‍රකීර්ති**
සන්නිවේදන දෙපාර්තමේන්තුව

බ්‍රෙටින්වුඩ්ස් එකඟතාවට අනුව නියම කරගත් ව්‍යවහාර මුදල් සම්මතය ලන්ඩන් රන් හවුල විසුරුවා හැරීමෙන් ද අවසන් නො වී ය. තවදුරටත් රන් ට්‍රෝයි අවුන්සයක නිල මිල එක්සත් ජනපද ඩොලර් 35 සීමාව තුළ ම රඳවා තැබිණි. රන් හවුල විසුරුවා හැරීමෙන් පසු සිදු වූයේ රන් මිල දෙ අකාරයකින් නියමවීම සඳහා ඉඩක් විවර වීම පමණකි. "රන් කවුළුවක්" විවෘත කිරීමක් ලෙසින් හැඳින්වූයේ එයයි. නිල රන් මිල වෙනස් නො කෙරිණි. එහෙත් එයට අමතර ව වෙළෙඳපොළ රන් මිලක පැවැත්ම ද සහතික කෙරිණි. කෙ සේ වුව ද, එ ලෙසින් විවෘත කරනු ලැබූ "කවුළුව" ඉතා පුළුල් එකක් වන්නේ නම් රන් සඳහා නිල මිලක් පවත්වා ගෙන යෑම නිරර්ථක කටයුත්තක් වනු නිසැක ය. එ හෙයින්, 1968 මාර්තු මාසයෙන් පසුව ද ඇමෙරිකා එක්සත් ජනපදය වෙහෙස වූයේ රන් ට්‍රෝයි අවුන්සයක මිල ඩොලර් 35 සීමාවෙහි ම රඳවා ගැනීමට ය.

මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රධාන ම ක්‍රියාමාර්ගය වූයේ ලොව ප්‍රධාන පෙළේ රන් නිෂ්පාදකයකු වන දකුණු අප්‍රිකාවට එරෙහි ව විකුණුම් වාරණයක් පැනවීම ය. මෙය සෘජු ලෙසින් පැන වූ සම්බාධකයක් නො වී ය. කෙ සේ වුව ද, ලොව බලවත් ම හමුදා ශක්තියට උරුමකම් කියන එක්සත් ජනපදය විසින් අනුගමනය කරන ලද එ කී ක්‍රියාමාර්ගය හැඳින්විය හැක්කේ රන් මිල ඩොලර් 35 මට්ටමේ පවත්වා ගැනීම සඳහා කළ බලහත්කාරකමක් ලෙසිනි. ඕනෑ ම බලාධිකාරියක් විසින් පවත්වා ගෙන යනු ලබන මූල්‍ය ක්‍රමයක් අසීරුතාවකට මුහුණ දුන් විට මෙ වැනි පියවරක් අනුගමනයට යොමු වීම වැළැක්විය හැකි නො වේ. නිදහස් බැංකු ක්‍රමයක දී වැරැදි වළක්වා ගන්නේ වෙළෙඳපොළ විනය තුළිනි. තරගකාරීත්වය හා බිඳ වැටීම් ඔස්සේ ඒ පරිචය නිදහස් බැංකු ක්‍රමය ගොඩ නඟා ගනියි. එහෙත් බලාධිකාරියක් විසින් මෙහෙයවනු ලබන බැංකු ක්‍රමයකට පැවැත්ම රැකගත හැක්කේ තම අධිකාරීත්වය තුළ ම ය.

මෙම ලිපියෙන් සාකච්ඡා කෙරෙන්නේ එ ලෙස රන් මිල පාලනය කරගැනීම සඳහා එක්සත් ජනපදය විසින් දකුණු අප්‍රිකාවට එරෙහි ව ක්‍රියාවෙහි යෙදූ වූ වාරණය පිළිබඳ ව ය. එම කාර්යය ඇරඹීමට පෙර ඒ සඳහා පසුබිම් වූ කරුණු නැවත වතාවක් කෙටියෙන් හෝ ගෙනහැර දැක්වීම වැදගත් වෙයි. දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ දී ඇති කරගත් බ්‍රෙටින්වුඩ්ස් එකඟතාවට අනුව ජාත්‍යන්තර ගනුදෙනු සඳහා යොදා ගත හැකි ව්‍යවහාර මුදල බවට එක්සත් ජනපද ඩොලරය පත් කෙරිණි. එක්සත් ජනපද ඩොලරයක අගය තීරණය කෙරුණේ රන් ග්‍රෑම් 0.888671 කට සමාන වන ලෙස ය. (එ නම්, රන් ට්‍රෝයි අවුන්සයක මිල එක්සත් ජනපද ඩොලර් 35 ක් වන ලෙස ය). අනෙකුත් සෑම ව්‍යවහාර මුදලක් ම එක්සත් ජනපද ඩොලරය සමඟ විවිධ වූ විනිමය අනුපාතවලට යටත් ව ගැට ගසා තිබුණි. ජාත්‍යන්තර වෙළෙඳාම් කටයුතු සඳහා වුවමනා වූ ඩොලර් ෆෙඩරල් සංචිත බැංකුව නිකුත් කළේ ය. ඩොලර් මිල දී ගැනීමට අපේක්ෂා කළ රජයක් හෝ මහ බැංකුවක් හෝ විසින් කළ යුතු ව තිබුණේ ඒ සඳහා ප්‍රමාණවත් රන් ෆෙඩරල් සංචිත බැංකුවට ලබා දී ඒ වෙනුවෙන් ඩොලර් හුවමාරු කරගැනීම ය. අවශ්‍ය විටෙක ඩොලර් ආපසු ලබා දී රන් ආපසු ලබාගැනීමේ හිමිකම ද විදේශ රජයන්ට හා මහ බැංකුවවලට ලබා දී තිබිණි.

මෙම කාරණය සඳහා වන පදනම වැටුණේ එක්සත් ජනපදය සතු ව තිබූ රන් සංචිතයේ විශාලත්වය මත ය. ටොන් 21,000 කට අධික රන් සංචිතයක් එක්සත් ජනපදය සතු ව තිබිණි. ලොව අන් සියලු මහ බැංකු සතු ව තිබූ රන් ප්‍රමාණය එක් කළ ද ඒ ප්‍රමාණය ඉක්මවිය හැකි නො වීය. එ හෙයින් රන් - ඩොලර් පරිවර්ත්‍යතාව ක්‍රියාවට නැංවීම පිළිබඳ සැකයක් කිසිවකු තුළ හෝ නො වී ය. මෙම පරිවර්ත්‍යතා හිමිකම ලබා දී තිබුණේ විදේශ රජයන්ට හා මහ බැංකුවලට පමණකි. පුද්ගලයන්ට හෝ අනෙකුත් ආයතනවලට හෝ ඒ හිමිකම නො ලැබිණි. කෙ සේ වුව ද, 1954 දී ලන්ඩන් රන් වෙළෙඳපොළ නැවත විවෘත කිරීමත් සමඟ ම රන් මිල ඉල්ලුම හා සැපයුම මත ද තීරණය වන්නට විය. එයට අමතර ව, යුද වියදම් ආදිය නිසා එක්සත් ජනපදයේ මුදල් සැපයුම ද තර වෙමින් පැවැතිණි. තව ද, එක්සත් ජනපදයේ වෙළෙඳ ශේෂයේ අඛණ්ඩ හිඟයක් ද වාර්තා වන්නට විය. විශාල වශයෙන් විදේශයන්ට ඩොලර් ගලා යන්නට වූ අතර එයින්

සැළකිය යුතු ප්‍රමාණයක් රන් වෙනුවෙන් හුවමාරු කරගැනීමට ෆෙඩරල් සංචිත බැංකුව කරා ඇදී එන්නට විය. එම හැසිරීම හේතු කොටගෙන එක්සත් ජනපදයේ රන් සංචිත බාදනය වන්නට ගත් විට රන් - ඩොලර් පරිවර්තනතාව පිළිබඳ සැක මතු ව ආවේ ය. ඒ නිසා, සැක දුරලීමේ හා විශ්වාසය ජනිත කරලීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් ලන්ඩන් රන් හවුල ආරම්භ කෙරිණි. ඒ සඳහා, එක්සත් ජනපදය සමඟ තවත් මහ බැංකු හතක් අත්වැල් බැඳ ගත්තේ ය. එහෙත්, ඒ හවුල ද 1968 වන විට බිඳ වැටිණි. නිල මිලට අමතර ව රන් සඳහා වෙළෙඳපොළ මිලක් ද නියම වීමට ඉඩ හරිනු ලැබුවේ එම වාතාවරණය තුළ ය.

මෙම වාතාවරණය තුළ නිල රන් මිල ආරක්ෂා කරගත හැක්කේ කෙ ලෙසින් ද? රන් සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම පහත හෙළීමෙනි. එය පහළ දැමිය හැක්කේ කෙ ලෙසින් ද? ලන්ඩන් රන් හවුල ඇති කිරීමෙන් අපේක්ෂා කළේ සැපයුම ඉහළ දැමීමෙන් රන් මිල පාලනය යි. එහෙත් එය අසාර්ථක විය. එ හෙයින්, සළකා බැලිය යුතු ව තිබුණේ එක ම එක විකල්පයකි. එ නම්, රන් සඳහා වන ඉල්ලුම පහළ දැමීම යි. මෙය කළ හැක්කේ කෙ ලෙසින් ද? විශාලතම ඉල්ලුම්කරුවන් වන මහ බැංකු රන් වෙළෙඳපොළට පිවිසීම වැළැක්වීමෙනි. ලන්ඩන් රන් හවුල බිඳ වැටීමෙන් අනතුරු ව එක්සත් ජනපදය අත පෙව්වේ මෙම කාර්යයට ය. අපි ඒ ගැන විමසා බලමු.

ලන්ඩන් රන් වෙළෙඳපොළ වසා දමා, ඒ සති අන්තයේ දී ලන්ඩන් රන් හවුල අවසන් කළ පසු ඉල්ලුම පාලනය කිරීමේ කාර්යයට මුල පිරිණි. ඒ කාර්යය වෙනුවෙන් ද එක්සත් ජනපදයට බටහිර යුරෝපීය රාජ්‍යයන් ගේ සහාය හිමිවිය. ඒ අනුව ප්‍රකාශයක් කරමින් එක්සත් ජනපද භාණ්ඩාගාර ලේකම් හෙන්රි ෆව්ලර් (Henry Fowler) ලෝකයේ සියලු මහ බැංකු වෙත දන්වා සිටියේ ගෝලීය මූල්‍ය ක්‍රමය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් සංචිත පවත්නා බවත් තදනන්තර ව මිල දී ගැනීම්වලට හෝ විකිණීම්වලට හෝ මහ බැංකු යොමුවීමේ අවශ්‍යතාවක් නැති බවත් ය.

මේ "අහිංසක" ආයාචනය තුළ ඉතා "වැදගත් ඇඟවීම්" ගණනාවක් ම ගැබ් ව තිබිණි. යම් ආකාරයකින් රන් මිල දී ගැනීම නැවැත්වීමට මහ බැංකු ක්‍රියා කළ හොත් ඒ සඳහා වන ඉල්ලුම වියළී යනු නිසැක ය. ඒ වන විට ගෝලීය රන් නිපැයුමෙන් සියයට 75 ක් උපදවනු ලැබුවේ දකුණු අප්‍රිකාව විසිනි. මහ බැංකු විසින් රන් මිල දී ගැනීම අත් හළ හොත් දකුණු අප්‍රිකාවට තමන් ගේ නිෂ්පාදන විකුණාගැනීමේ අවස්ථාව අහිමි වනු ඇත. ලොව රන් ඉල්ලුමෙන් අති විශාල ප්‍රමාණකට වගකීවේ මහ බැංකු විසිනි. එ වන් වාතාවරණයක් තුළ දකුණු අප්‍රිකාවට කළ හැකි එක ම කාර්යය වනු ඇත්තේ ලන්ඩන් රන් වෙළෙඳපොළට යොමුවීම පමණකි. මහ බැංකු විසින් මිල දී ගැනීම් අත්හළ විට රන් වෙළෙඳපොළේ ගනුදෙනු ආභරණ නිපදවන්නන්, සමපේක්ෂකයන් සහ අනෙකුත් පුද්ගලික පාර්ශ්වයන් අතරට පමණක් සීමා වනු ඇත. නැවත විවෘත කළ ලන්ඩන් රන් වෙළෙඳපොළෙහි මිල ගණන් ඩොලර් 39 ක් තරම් ඉහළ මට්ටමක පැවැතිණි. දකුණු අප්‍රිකාවේ සැපයුම රන් වෙළෙඳපොළට ළඟා වූ විට ඒ මිල ගණන් ඩොලර් 35 දක්වා පහත වැටෙනු ඇති බව ෆව්ලර් ගේ අපේක්ෂාව විය.


රන් මිල මැඩීමේ නවතම උපක්‍රමය සැලසුම් කෙරුණේ ඒ ආකාරයෙනි. රන් මිල දී ගැනීමෙන් වළකින ලෙස ඉල්ලා ලොව පුරා විසිරුණු මහ බැංකු 95 ක් වෙත ලිපි නිකුත් කෙරිණි. දකුණු අප්‍රිකානු රන් වර්ජනය ඇරඹිණි!

එහෙත් ආරම්භයේ දී ම, රන් වර්ජනය අසාර්ථක විය. රන් මිල ඩොලර් 42 දක්වා ම ඉහළ නැංගේ ය. නිල රන් මිල වූ ඩොලර් 35 සමඟ සැළකූ විට එය සියයට 20 ක ඉහළ මට්ටමකි. ඒ හේතුවෙන් මුළුමහත් බ්‍රෙට්න්වුඩ්ස් එකඟතාව ම හෑල්ලුවට ලක් විය. ඒ ඔස්සේ ඉතාමත් සරල පණිවිඩයක් ප්‍රකාශයට පත්විය. මූල්‍ය අධිකාරීන් විසින් ප්‍රකාශ කළ ආකාරයට එක්සත් ජනපද ඩොලරයක් වෙනුවෙන් රන් ග්‍රෑම් 0.81 ක් ලබා දීමට වෙළෙඳපොළ එකඟ නො වීම ඒ පණිවිඩය යි. ඒ වෙනුවට වෙළෙඳපොළ කැමැති වූයේ ඩොලරයක් වෙනුවෙන් රන් ග්‍රෑම් 0.67 ක් පමණක් ලබාදීමට ය.

මහ බැංකු වෙත ඩොලර් ලැබුණේ රන් පරිවර්තනතාවෙන් පමණක් නො වේ. එක්සත් ජනපදය වෙත අපනයනය කළ භාණ්ඩ හා සේවා වෙනුවෙන් ද මහ බැංකු වෙත ඩොලර් ගලා ආවේ ය. එ බැවින් නිල රන් මිල සහ වෙළෙඳපොළ රන් මිල අතර පැවැති වෙනස විසින් ඉතා පැහැදිළි පාරස්පර අවස්ථාවක් මහ බැංකු වෙත හිමි වී තිබිණි. ඔවුන් කළ යුතු ව තිබුණේ තමන් සන්තක ඩොලර් ෆෙඩරල් සංචිත බැංකුවට ලබා දී ඒ වෙනුවෙන් රන් ලබාගෙන ඒවා ලන්ඩන් වෙළෙඳපොළෙහි විකිණීම ය. මේ හේතුවෙන් එක්සත් ජනපදයෙන් රන් පිටත ගලා යෑම තවදුරටත් කුළු ගැන්විණි.

**1 වන රූප සටහන**

**දකුණු අප්‍රිකානු සංචිත බැංකුව සතු රන් ප්‍රමාණය: 1960 - 1970**





**මූලාශ්‍රය: World Gold Council**

මෙම උපද්‍රවයට හේතු වී තිබුණේ අපේක්ෂා කළ ආකාරයෙන් ලන්ඩන් වෙළෙඳපොළට දකුණු අප්‍රිකානු රන් ගලා නො ඒම ය. වෙළෙඳපොළට නිකුත් නො කොට නිධිවලින් උකහාගත් රන් තමන් ගේ රක්ෂිතාගාර තුළ රැස්කිරීම දකුණු අප්‍රිකානු සංචිත බැංකුව විසින් ආරම්භ කොට තිබිණි. 1968 වසර අවසන් වන විට දකුණු අප්‍රිකානු සංචිත බැංකුව සතු වූ රන් ප්‍රමාණය වසරේ ආරම්භක තොගය මෙන් දෙගුණයක් බවට පත් විය. (1 වන රූප සටහන බලන්න).

මහ බැංකුවලට රන් විකිණීමට ඇති අවස්ථාව වැළැක්වීමෙන් දකුණු අප්‍රිකාවට අපනයන ආදායමක් අහිමි විය. ඒ හේතුවෙන් තම ආනයන වෙනුවෙන් ගෙවීමේ හැකියාව දකුණු අප්‍රිකාවට අහිමි කෙරිණි. කෙ සේ වුව ද, 1965 වසරේ සිට ම ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තයකට හිමිකම් කී නිසා එම අභියෝගයට සාර්ථක ව මුහුණදීමට දකුණු අප්‍රිකාවට හැකි විය. 1966 වසරේ දී පසුබෑමකට ලක්වුව ද එයින් පසු දිගින් දිගට ම ගෝලීය කොටස් වෙළෙඳපොළ ද හිස ඔසවමින් පැවැතිණි. (2 වන රූප සටහන බලන්න). එක්සත් ජනපද අභියෝගය හමුවේ නො සැළී සිටි දකුණු අප්‍රිකාව නව ආයෝජන අවස්ථා දිනාගැනීමට ද සමත්විය. ඒ හේතුවෙන් ප්‍රාග්ධනය තවදුරටත් රට තුළට ගලා එන්නට විය. රන් නො විකිණීමේ ප්‍රතිපත්තිය මේ සියල්ල විසින් දිරිගන්වන ලදී.

**2 වන රූප සටහන:**

**ඩව් ජෝන්ස් දර්ශකයේ හැසිරීම: 1965 - 1969**




**මූලාශ්‍රය: www.econstats.com**

වර්ජනය හේතු කොටගෙන එක්සත් ජනපදය සහ දකුණු අප්‍රිකාව අතර හටගත්තේ කුකුළු පොරයකට සමාන තත්ත්වයකි. දෙපාර්ශ්වය ම තමන් ගේ ජයග්‍රහණය පිළිබඳ මහත් අපේක්ෂාවකින් පසු වූ අතර අනෙකා ගේ පරාජය පිළිබඳ විශ්වාසයකින් සිටියේ ය. දකුණු අප්‍රිකාවට ගලා ගිය ප්‍රාග්ධන ප්‍රවාහය සිඳෙනු ඇති බව ද ආනයන වෙනුවෙන් ගෙවීමට තම රන් සංචිත වෙළෙඳපොළෙහි විකිණීමට ඔවුනට සිදු වනු ඇති බව ද එක්සත් ජනපදයේ විශ්වාසය විය. නිල මිල සහ වෙළෙඳපොළ මිල අතර පරතරය තවදුරටත් වැඩි වනු ඇති බව ද ඒ හේතුවෙන් පීඩාවට පත්වන මහ බැංකු රන් මිල දී ගැනීමට යොමුවනු ඇති බව ද දකුණු අප්‍රිකාවේ විශ්වාසය විය. තව ද, බොහෝ දකුණු අප්‍රිකානුවන් ගේ මූලික ම අපේක්ෂාව වූයේ ඩොලරය අවප්‍රමාණය වනු දැකීම ය. ඩොලරය අවප්‍රමාණය වන්නේ නම් තමන් ගේ රන් වෙනුවෙන් වැඩි මුදලක් ලබාගැනීමට දකුණු අප්‍රිකාවට පුළුවන. එය ඔවුන් ගේ ප්‍රධානතම ආදායම ය.

එයට අමතර ව, මෙම බාධකය බිඳ දැමීමේ මං කෙරෙහි ද දකුණු අප්‍රිකාවේ අවධානය යොමු වී තිබිණි. ඔවුන ගේ උත්සාහය වූයේ වර්ජනයෙන් මිදෙන මහ බැංකුවලට අඩු මිලකට රන් විකිණීම ය. 1968 වසරේ අවසානයේ දී වර්ජනය අත් හළ පෘතුගාලය ඩොලර් දශලක්ෂ 150 ක් වටිනා රන් දකුණු අප්‍රිකාවෙන් මිල දී ගත්තේ ය. 1969 දී තවත් ඩොලර් දශලක්ෂ 120 ක් වටිනා රන් මිල දී ගැනීමට පෘතුගාලය ක්‍රියාකළේ ය. අනෙකුත් යුරෝපීය මහ බැංකු ද සීමාව පැනීමට සූදානම් බවට කතා පැතිර යන්නට විය.

තමන් ගේ රන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට විකිණීමේ ඉඩක් ද දකුණු අප්‍රිකාවට විය. සාමාජික රටක් විසින් ලබා දෙන රන් ඕනෑ ම ප්‍රමාණයක් මිල දී ගැනීමට මූලික එකඟතා අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බැඳී තිබේ. අරමුදලෙහි ප්‍රධානියා වූ පියරේ පෝල් ශ්වයිට්සර් (Pierre-Paul Schweitzer) ඇතුළු නිලධාරීන් බහුතරයක ගේ මතය වූයේ ද එය ය. එහෙත්, එක්සත් ජනපද භාණ්ඩාගාරික ලේකම් ෆවුලර් ඒ අදහසට එකඟ නො වී ය. ඔහු කීවේ ජාත්‍යන්තර අරමුදල කිසි ම රටක රන් මිල දී ගැනීමට බැඳී නැති බවකි. විශේෂයෙන් ම, දකුණු අප්‍රිකාව සඳහා සහනයක් සැලසීමේ වුවමනාවක් එක්සත් ජනපදයට නො වී ය.

මේ ගැටලුවට ප්‍රායෝගික ව මුහුණදීමේ අවස්ථාව 1968 මැයි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට උදාවිය. දකුණු අප්‍රිකාව තමන් සතු රන් අවුන්ස දශ ලක්ෂයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට විකිණීමට උත්සාහ කළේ ය. එහෙත් රන් මිල දී ගැනීමේ නීත්‍යානුකූල බව ගැන වාද කරමින් ඒ අවස්ථාව අරමුදල විසින් පැහැර හැරියේ ය. අරමුදලෙහි තීරක අයිතියෙන් සියයට 25 කට හිමිකම් කී එක්සත් ජනපදය එහි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙහි ලා ප්‍රමුඛ පෙළේ කාර්යයක් ඉටු කළේ ය. ප්‍රතිඵලය වූයේ තම රන් විකුණාගැනීම සඳහා දකුණු අප්‍රිකාවට තිබූ තවත් දොරක් විවර නො වීම ය. ඇත්තෙන් ම, ඒ සඳහා වූ දොරක් වසා දැමීම ය!

කෙ සේ වෙතත්, එම වසර මුළුල්ලේ ම ලන්ඩන් වෙළෙඳපොළට සුළු ප්‍රමාණවලින් රන් සපයමින් මිල හැසිරීම පරීක්ෂා කිරීම ද දකුණු අප්‍රිකාව විසින් නො කඩවා ම කරගෙන ගියේ ය. රන් මිල එක්සත් ජනපද ඩොලර් 38 දක්වා පහත වැටුණු අවස්ථා ද විය. කෙ සේ වුව ද, වසර අවසන් වන විට රන් මිල නැවතත් ඩොලර් 42 දක්වා ඉහළ ගියේ ය. තව ද, අදාළ කාලය තුළ දී ඩොලර් මිලියන 200 - 400 ක් තරම් වටිනා රන් දකුණු අප්‍රිකාවෙන් මිල දී ගැනීමට ස්විස්

බැංකු තුනක් ක්‍රියා කළේ ය. දකුණු අප්‍රිකාවට සිටි සාම්ප්‍රදායික ගනුදෙනුකරුවා වූයේ එංගලන්ත බැංකුවයි. එහෙත්, එය සමඟ ගනුදෙනු කිරීමේ උවමනාවක් දකුණු අප්‍රිකාවට නො වී ය. එයට හේතු වූයේ එංගලන්ත බැංකුවට ෆෙඩරල් සංචිත බැංකුව සමඟ වූ කිට්ටු සබඳතාව යි. ඒ හේතුවෙන් තම ගනුදෙනුවල රහසිගත බව රැකගැනීමට නො හැකි වනු ඇතැයි දකුණු අප්‍රිකාව විශ්වාස කළේ ය.

1968 ඔක්තෝබර් වන විට ද රන් මිල පැවැතියේ ඩොලර් 35 සීමාවට බොහෝ ඉහළිනි. කෙ සේ වුව ද, දකුණු අප්‍රිකාව විවිධ ක්‍රමවලින් තවදුරටත් රන් විකුණමින් සිටියේ ය. එ හෙයින්, දකුණු අප්‍රිකානු රන් වර්ජනය මුළුමනින් ම අසාර්ථක එකක් බවට පත් ව තිබුණේ ය. එයට පිළියමක් වශයෙන් දකුණු අප්‍රිකාව සමඟ සමථයකට එළැඹීමට හෙන්රි ෆව්ලර් තීරණය කළේ ය. එම තීරණයට අනුව දකුණු අප්‍රිකාවට තම රන් නිෂ්පාදනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට විකිණීමට හැකි අතර මහ බැංකු වෙත විකිණීමෙන් වැළැකී සිටිය යුතු ය. කෙ සේ වුව ද, ඒ සඳහා ඉඩකඩ ලැබෙන්නේ රන් මිල ඩොලර් 35 න් පහළට වැටෙන්නේ නම් හෝ දකුණු අප්‍රිකාව ප්‍රාග්ධන ගිණුමේ හිඟයකට මුහුණ දී සිටින්නේ නම් හෝ පමණකි.


මෙම සැලැස්ම රන් මිල සඳහා ඩොලර් 35 ක යටත්තිමක් නියම කිරීමකි. ඒ අනුව, ඩොලර් 35 න් පහළට රන් මිල වැටුණු විට දකුණු අප්‍රිකානු රන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගලා යන අතර ඒ හේතුවෙන් වෙළෙඳපොළ මිලට බලපෑමක් ඇති නො වනු ඇත. ඒ අනුව, එක්සත් ජනපදය අපේක්ෂා කළ අයුරින් මිල ස්ථාවර වනු ඇත. කෙ සේ වුව ද, ඒ වන විට ද දකුණු අප්‍රිකාව අත්විඳිමින් සිටියේ ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තයකි. තව ද, රන් මිල පැවැතියේ ඩොලර් 35 ට බොහෝ ඉහළ අගයක ය. එ හෙයින්, එම යෝජනාවට අවනතවීමෙන් දකුණු අප්‍රිකාවට හිමිවන වාසියක් පෙනෙන තෙක් මානයක නො වී ය. ඒ හේතු ව නිසා, එම යෝජනාව දකුණු අප්‍රිකාව ඉවත දැම්මේ ය.

එහෙත්, 1966 සිට ලොව වටා අත්දුටු කොටස් වෙළෙඳපොළ පිබිදීම ඒ වන විට අවසන් වී තිබිණි. ඒ සමඟ ම, 1969 - 70 කාලයේ දී වාර්තා වූ තරස් (Bear) වෙළෙඳපොළ තත්ත්වයට මුල පුරමින් සියලු දර්ශක යටියතට යොමු විය. ආයෝජකයින් ආකර්ෂණය කරගනිමින් සිටි දකුණු අප්‍රිකාවේ ප්‍රභාව ද ඒ සමඟ ම වියැකෙන්නට විය. වසර තුනකට පසු පළමු වතාවට, 1969 දෙවන කාර්තුවේ දී දකුණු අප්‍රිකානු ප්‍රාග්ධන ගිණුමෙහි හිඟයක් වාර්තා විය. පෙර වසරේ පළමු භාගයේ දී පවුම් මිලියන 218 ක් වූ ශුද්ධ පුද්ගලික ප්‍රාග්ධනය ගලනය 1969 වන විට පවුම් මිලියන 11.7ක් දක්වා පහත වැටුණේ ය.

දකුණු අප්‍රිකාව විවෘත වෙළෙඳපොළෙහි රන් විකිණීමට යොමුවීමෙන් වැළැක් වූ ප්‍රධානතම ආධාරකය බිඳී ගියේ ය. ආනයන මූල්‍යයනය උදෙසා තම රන් විවෘත වෙළෙඳපොළෙහි විකිණීම දකුණු අප්‍රිකාව ඇරඹීය. 1969 මැයි අග වන විට ඩොලර් බිලියන 1.4 ක් වූ සංචිත ජූලි මාසය වන විට බිලියන 1.2 දක්වා ද අගෝස්තු මාසය වන විට බිලියන 1.1 දක්වා ද පහත වැටිණි. ලන්ඩන් රන් වෙළෙඳපොළෙහි මිල ද පහත වැටෙන්නට විය. 1969 මැයි මාසයේ දී රන් මිල වාර්තා වී තිබුණේ ඩොලර් 43.46 ක් වශයෙනි. අගෝස්තු වන විට එය ඩොලර් 41.13 දක්වා පහත වැටිණි. (3 වන රූප සටහන බලන්න). ඒ වන විට දකුණු අප්‍රිකාවේ සම්පූර්ණ රන් නිෂ්පාදනය - එ නම්, සතියකට ටොන් 20 ක්; වෙළෙඳපොළට ගලා එමින් තිබිණි.

**3 වන රූප සටහන**
**රන් මිල විචලනය: 1968 ජනවාරි - 1969 ඔක්තෝබර්**

(එ.ජ. ඩොලර්)




**මූලාශ්‍රය: The Data Hub**


ඔක්තෝබර් වන විට තවත් පහළට - එ නම්, ඩොලර් 40.48 දක්වා; වැටුණු රන් මිල නොවැම්බර් වන විට ඩොලර් 37.45 ක් බවට පත් විය. දෙසැම්බර් වන විට එය ඩොලර් 35.19 දක්වා ම පහත වැටුණු අතර ජනවාරි 16 දා වන විට ඩොලර් 34.80 ක් බවට පත් විය. ඒ, 1954 දී ලන්ඩන් රන් වෙළෙඳපොළ නැවත විවෘත කිරීමෙන් පසු වාර්තා වූ අඩු ම මිල යි!

ඒ සමඟ ම, මහ බැංකු වෙත නැවතත් රන් විකුණා මුදල් ඉපැයීමේ අනගි අවස්ථාවක් උදා විය. එහෙත් ඒ, එක්සත් ජනපදයේ සංචිත හීන කරමින් නො වේ. එහි සංචිත තර කරමිනි. ලන්ඩන් රන් වෙළෙඳපොළෙන් ඩොලර් 34.80 කට රන් මිල දී ගන්නා මහ බැංකු ඒවා ෆෙඩරල් සංචිත බැංකුවට විකුණා අවුන්සයකට ඩොලර් සත 2.5 ක ලාභයක් උපයාගත්තේ ය. (රන් මිලෙහි වෙනසින් මහ බැංකුවලට ලාභ ඉපැයීමට හැකි ව තිබූ ආකාරය පසුගිය කලාපයේ පළ කළ ලිපියෙහි විස්තර කර ඇත). 1968 වන විට මෙට්‍රික් ටොන් 9679 ක් වූ එක්සත් ජනපද රන් සංචිත ප්‍රමාණය 1969 වන විට මෙට්‍රික් ටොන් 10539 දක්වා ඉහළ නැගුණේ ය. වාසනාව පිල් මාරු කළේ ය. ෆව්ලර් ගේ සැලසුම සාර්ථක විය. ඩොලර් 35 කට සීමාවීමට රන් මිල නැවත වතාවක් අවනත විය.

වසරකට පෙර එක්සත් ජනපදය කළ යෝජනාවට 1969 දෙසැම්බර් මාසයේ දී දකුණු අප්‍රිකාව එකඟ විය. ඒ හේතුවෙන්

**4 වන රූප සටහන**

**රන් මිල විචලනයඃ 1950 ජනවාරි - 1970 දෙසැම්බර්**




**මූලාශ්‍රයඃ The Data Hub**

තම අභිමතය පරිදි රන් විකිණීමට දකුණු අප්‍රිකාවට තිබූ නිදහස අහිමි විය. ඔවුනට කළ හැකි වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පමණක් රන් විකිණීමට ය. එය ද කළ හැකි ව තිබුණේ රන් මිල ඩොලර් 35 ට අඩු ව පවතින්නේ නම් පමණකි. සියල්ල අහිමි කරගැනීමට වඩා එය යහපත් තත්ත්වයකි. අඩු ම තරමින්, එම එකඟතාව නිසා රන් සඳහා ඩොලර් 35 යටත්තිමයක් සැකසෙයි. ඒ පදනම මත දකුණු අප්‍රිකානු රන් නිෂ්පාදන සඳහා සුරක්ෂිත මිලක් හිමි වෙයි.

එක්සත් ජනපදයේ ජයග්‍රහණය වර්ණනා කෙරෙන ලිපිවලින් පුවත්පත් සඟරාවල පිටු පිරෙන්නට විය. එම ජයග්‍රාහී ජනවාරියේ නිව්යෝර්ක් ටයිම්ස් (New York Times) පුවත්පතෙහි පළ කළ ලිපියක මෙ සේ සඳහන් විය.

"ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයට අකුල් හෙළීම සඳහා රන්වලට තිබූ බලය විශාල වශයෙන් මෙල්ල කොට ඇත. සැබැවින් ම, අවසන් කොට ඇතැයි කීමේ ද වරදක් නො වේ. භාණ්ඩාගාර උප ලේකම් පෝල් ඒ වොලකර් (Paul A Volcker) බලාපොරොත්තු පළ කොට ඇත්තේ 'කලහකාරී මූල්‍ය ගැටලුවක්' වන රන් මිලෙහි හැසිරීම දමනය කිරීමට හැකි වන බවට යි."

මේ සියලු සැමරීම්, වගාඩම්බර කතා පැවැතියේ ඉතා සුළු කාලයකි. අප්‍රේල් මාසය වන විට රන් මිල නැවතත් ඩොලර් 35.62 දක්වා ඉහළ ගියේ ය. සැප්තැම්බර් වන විට එය ඩොලර් 36 සීමාව ද ඉක්මවා ගියේ ය. ඒ, එක්සත් ජනපද ඩොලර් 36 සීමාවට රන් මිල සදහට ම ආයුබෝවන් කී අවස්ථාවයි. 1950 සිට 1970 දෙසැම්බර් දක්වා වූ කාලය තුල රන් මිල හැසිරුණු අන්දම 4 වන රූප සටහනෙන් නිරූපණය කෙරෙයි. එ තැන් පටන් ඇරඹියේ රන් මිල විසින් ඩොලරයේ බලය බිඳ හෙළීමේ පෙළහරයි. ඒ පිළිබඳ සාකච්ඡාව ඉදිරි ලිපියකින් සිදු කෙරෙනු ඇත.✪

## 2011 වසරේ ආර්ථිකය සැකෙවින්

### ආර්ථික වර්ධනය, උද්ධමනය හා සේවා වියුක්තිය

- ආර්ථික වර්ධනය මෙතෙක් වාර්තාගත ඉහළම අගය වන සියයට 8.3 දක්වා ඉහළ ගියේය. මෙය ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව වසර දෙකක් සියයට 8 ඉක්මවා වර්ධනය වූ ප්‍රථම අවස්ථාව වේ.
- ඒක පුද්ගල ආදායම පෙර වසරේ පැවති එ.ජ.ඩොලර් 2,400 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් 2,836 දක්වා ඉහළ ගියේය.
- උද්ධමනය අඛණ්ඩව තුන්වන වසරටත් තනි ඉලක්කමක මට්ටමෙහි පැවතුණි.
- සේවා වියුක්තිය මෙතෙක් වාර්තාගත අඩුම අගය වන සියයට 4.2 දක්වා පහත වැටුණි.
- තරුණයන් අතර සේවා වියුක්තිය සැලකිය යුතු ලෙස පහත බැස ඇත.

### විදේශ අංශය

- සියයට 22.4 ක් වූ අපනයන වර්ධනය විශාල වශයෙන් ඉක්මවා යමින් ආනයන සියයට 50.7 කින් වර්ධනය විය.
- ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළෙඳ හිඟය සියයට 16.4 ක් දක්වා තියුණු ලෙස ඉහළ ගියේය.
- සංචාරක පැමිණීම් 850,000 ඉක්ම වූ අතර සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 830 ක් ලෙස වාර්තා විය.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් බිලියන 5.1 ක් විය.
- පසුගිය වසර දහය තුළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් සියයට 3.1 ක් පමණ වූ වර්තන ගිණුමේ හිඟයට සාපේක්ෂව මෙම වසර තුළ එය ද.දේ.නි.යෙන් සියයට 7.8 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
- මෙ රටට ලැබුණ සෘජු විදේශීය ආයෝජන ප්‍රථම වරට එ.ජ.ඩොලර් බිලියන 1 ඉක්මවිය.
- ගෙවුම් තුලනය එ.ජ.ඩොලර් බිලියන 1.1 ක හිඟයක් වාර්තා කළේය.
- දළ නිල සංචිත 2010 දෙසැම්බර් අග පැවති එ.ජ.ඩොලර් බිලියන 6.6 ට සාපේක්ෂව මෙම වසර අවසානයේ එ.ජ.ඩාලර් බිලියන 6.0 ක් විය.
- වසර අග වන විට එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 2.6 කින් අවප්‍රමාණය විය.

### රාජ්‍ය මූල්‍ය අංශය

- රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මත වන අවධානය 2011 වසර තුළ ද තවදුරටත් පැවතිණි.
- රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ. ප්‍රතිශතයක් ලෙස 2010 දී පැවති සියයට 14.6 සිට සියයට 14.3 දක්වා අඩු විය.
- වියදම් හා ශුද්ධ ණය දීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 21.5 ක පවත්වාගෙන යනු ලැබිණ.
- අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.9 ක් වූ අතර මෙය ඉලක්කගත මට්ටමට වඩා සුළු වශයෙන් වැඩි වීමකි.
- ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය 2010 පැවති සියයට 81.9 සිට සියයට 78.5 දක්වා පහත වැටුණු අතර මෙය පසුගිය වසර 30 කට ආසන්න කාලයක් තුළ සියයට 80 කට වඩා අඩු වූ ප්‍රථම අවස්ථාව විය.
- රජය එ.ජ.ඩොලර් බිලියන 1 ක වටිනාකමකින් යුතු හතරවන ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කරන ලදී.

### මුදල් හා මූල්‍ය අංශය

- පෞද්ගලික අංශය විසින් සිදුකරනු ලබන ආයෝජන දිරිගැන්වීම සඳහා 2011 ජනවාරි මාසයේ දී ප්‍රධාන පොලී අනුපාතික පහත දමන ලදී.
- අතිරික්ත ද්‍රවශීලතාවයෙන් කොටසක් ස්ථාවර පදනම මත අවශෝෂණය කර ගැනීම සඳහා අප්‍රේල් මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක එකකින් සියයට 8 දක්වා වැඩි කරන ලදී.
- මුදල් සැපයුමේ වාර්ෂික සාමාන්‍ය වර්ධනය සියයට 19.3 ලෙස ඉලක්කගත මට්ටම අභිබවා නොකඩවා පැවතුණි.
- වසරේ ප්‍රථම කාර්තු 3 තුළ බොහෝදුරට ස්ථායීව පැවති වෙළෙඳපොළ පොලී අනුපාතික ඉන් පසුව ඉහළ යන්නට විය.
- මූල්‍ය පද්ධති ස්ථායීතාව තවදුරටත් සුරක්ෂිතව පැවතුණි.
- නව මුදල් ව්‍යාපාර පනතක් හඳුන්වා දුන් අතර ඒ යටතේ නව විධාන කිහිපයක් නිකුත් කරන ලදී.
- වසර තුළ දී අක්‍රීය ණය අනුපාත පහත බසින ලදී.
- බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පහළ වැටුණ ද බැංකු පද්ධතියේ සමස්ත ප්‍රාග්ධන අරමුදල් වර්ධනය විය.
- මූල්‍ය ආයතනවල ශාඛා පද්ධතිය තවදුරටත් ව්‍යාප්ත වීමත් සමග මූල්‍ය පහසුකම් වෙත ඇති ප්‍රවේශය වැඩිදියුණු විය.

**( 2011 - ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන්)**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.